# ශ්‍රී ලංකාවේ මෑතකාලීන ආර්ථික අර්බුදය වී වගාකරුවන්ට ඇතිකරන ලද සමාජ, ආර්ථික බලපෑම

එන්. පී. පෙරේරා සහ පී. කොඩිතුවක්කු

## හැඳින්වීම

### ශ්‍රී ලංකාවේ ආර්ථික අර්බුදය

1970 දශකයේ අඩු ආදායම්ලාභී ජාතියක් සඳහා වන සංවර්ධන සාර්ථකත්වයට ප්‍රශංසාවට ලක් වූ ශ්‍රී ලංකාව 2019 සිට අද දක්වා මූල්‍ය හා ආර්ථික ව්‍යසනයක ගිලී ඇත. ආර්ථිකයේ ව්‍යුහාත්මක ඌනතා දීර්ඝ කාලයක් තිස්සේ පැවතුන ද, ශ්‍රී ලංකාවේ වත්මන් ආර්ථික අර්බුදය ආරම්භ වූයේ 2019 වසරේ දීය. එය 1948 නිදහසින් පසු ශ්‍රී ලංකාව අත්පත් කරගත් දරුණුතම ආර්ථික ව්‍යසනය වේ. 2013 සිට 2019 දක්වා බොහෝ දුරට පැවති ස්ථාවර වර්ධන වේගය බිඳ වැටී වර්තමානයේ පවතින ආර්ථික බිඳ වැටීමට හේතු වී තිබෙන්නේ මුදල් උත්පාදනය,බදු කප්පාදුව , ජීවවිද්‍යාත්මක හෝ කාබනික ගොවිතැනට මාරුවීමේ ජාතික ප්‍රතිපත්තිය ඇතුළු වැරදි කළමනාකාරීත්ව ආර්ථික ක්‍රියාමාර්ග හා 2019 පාස්කු බෝම්බ ප්‍රහාරය (covid-19) වසංගතය හා යුක්රේන රුසියා ගැටුම ඇතුළු බාහිර සාධක වේ.

පවතින අර්බුදය වාර්තාගත මට්ටමේ උද්ධමනය, විදේශ සංචිත ක්ෂය වීම, වේගයෙන් අවප්‍රමාණය වන මුදල්, ආනයන සඳහා ගෙවීමට නොහැකි වීම සහ මහ බැංකුව විසින් පොලී අනුපාත වැඩි කිරීම ඇතුළත් වේ. 2022 මැයි මාසයේදී ශ්‍රී ලංකාව සිය ඉතිහාසයේ ප්‍රථම වතාවට ණය පැහැර හැරියේය. පාරිභෝගික මිල උද්ධමනය 50% ඉක්මවා ගිය අතර ආහාර, ඖෂධ සහ ඉන්ධන වැනි මූලික භාණ්ඩවල දැඩි හිඟයක් පවතී.රටේ ඉහළ යන විදේශ ණය, (COVID-19) සහන ක්‍රියාමාර්ග

ක්‍රියාත්මක කිරීම සඳහා රජයේ වියදම් ඉහළ යාමත් සමඟ දේශීය ආර්ථිකය ව්‍යුහාත්මකව තවදුරටත් දුර්වල කර ඇත. රටේ දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන වේගය 2010 දී සියයට 8.01 සිට 2020 දී 3.56 දක්වා - 3.56 දක්වා පහත වැටී ඇත.

2019 අග භාගයේදී සහ 2020 මුලදී වසංගතයට පෙර, මැතිවරණ පොරොන්දුවක් ඉටු කිරීම සඳහා රජය ගැඹුරු බදු කප්පාදුවක් ක්‍රියාත්මක කළේය. මෙය 2020 සහ 2022 අතර දළ වශයෙන් බදු ගෙවන්නන් මිලියනයක් අහිමි වීමට හේතු විය. දැනටමත් පැතිරුණු බදු පැහැර හැරීම්වලින් පීඩා විඳි ආර්ථිකයකට දැවැන්ත අභියෝගයකි. මෙම බදු අඩු කිරීම් වලට පෙර, ශ්‍රී ලංකාව දැනටමත් කලාපයේ අඩුම බදු ආදායම්-ද.දේ.නි. මෙම කප්පාදුව මහා භාණ්ඩාගාරය මත තවත් බරක් ඇති කළේය. 2019 සහ 2020 හි සැලසුම් නොකළ බදු කප්පාදුවෙන් පසු 2021 දී අනුපාතය සියයට 7.7ක් දක්වා පහත වැටුණි.

ශ්‍රී ලංකාව කෘෂිකාර්මික රටක් වශයෙන් ආර්ථික මට්ටම අතින් තවමත් සංවර්ධනය වන රටක් වශයෙන් හඳුනාගත හැකිය. කෘෂිකර්මාන්තය මූලික කරගත් ශ්‍රී ලංකාව තුළ වී වගාව ප්‍රධාන ආර්ථික බෝගයක් වන අතර එය ශ්‍රී ලාංකිකයන්ගේ සංස්කෘතික හා සමාජ ක්‍රමය කෙරෙහි බලපානු ලබයි. ඒ හේතුවෙන් ශ්‍රී ලංකාවේ වී වගාව කෙරෙහි සිදුවන විචලනයන් පිළිබඳව අවධානය යොමු කිරීම වැදගත් වන අතර ග්‍රාමිය ප්‍රදේශවල බහුතර ගොවීන් විසින් වගා කරන ප්‍රධාන බෝගය සහල් වන අතර එය ශ්‍රී ලංකාවේ මිලියන 20 ක පමණ වැසියන්ගේ ප්‍රධාන ආහාරය වේ (Karunanayake & Aponsu, 2019). කෘෂිකාර්මික දළ දේශීය නිෂ්පාදිතයට (GDP) බෝග අංශයේ දායකත්වයෙන් 30% ක් පමණ සහල් අංශයෙන් වේ

ශ්‍රී ලංකාවේ වී ගොවිතැන මහා වාරිමාර්ග,සුළු වාරිමාර්ග හා වර්ෂා ජලය භාවිතා කරමින් සිදුකරනු ලබයි. වාරිමාර්ග ලංකාවේ ග්‍රාමීය ආර්ථිකයේ කොඳු නාරටියයි. මක්නිසාද යත්, වගා කළ හැකි ඉඩම්වලින් 25% ක් සහ ගොවි පවුල් මිලියන දෙකක් (ග්‍රාමීය පවුල්වලින් 65% ක්) ඔවුන්ගේ ප්රධාන රැකියාව ලෙස කුඹුරු ගොවිතැනෙහි නිරත වන බැවිනි (Shantha, 2011). අධික ජල අවශ්‍යතා සහිත වී වගාව රටේ ආහාර නිෂ්පාදනය සඳහා වෙන් කර ඇති මුළු ජලයෙන් සියයට 70කට වඩා පරිභෝජනය කරයි (Henegedara, 2002).ලංකාවේ වාරිමාර්ග යෝජනා ක්‍රම ප්‍රධාන, මධ්‍යම සහ කුඩා යෝජනා ක්‍රමවලට බෙදා ඇත්තේ භූමි ප්‍රමාණය හෝ අණදෙන ප්‍රදේශ පදනම් කරගෙනය (Thiruchelvan, 2009). ප්‍රධාන වාරිමාර්ග යෝජනා ක්රම හෙක්ටයාර් 1,000 ට වැඩි විධාන ප්‍රදේශයක් ඇති ඒවා ලෙස අර්ථ දක්වා ඇති අතර, හෙක්ටයාර 80 ත් 1,000 ත් අතර පද්ධති මධ්‍යම වාරි යෝජනා ක්‍රමය ලෙස සැලකේ. සුළු වාරිමාර්ග යෝජනා ක්රම යනු හෙක්ටයාර 80ක් හෝ ඊට අඩු ප්‍රදේශයක් සහිත ඒවාය. ප්‍රධාන වාරි භෝග වන වී වගාව හෙක්ටයාර් 730,000කට ආසන්න භූමි ප්‍රමාණයක වගා කෙරෙන අතර, මෙයින් හෙක්ටයාර් 389,000ක් ප්‍රධාන වාරිමාර්ග යෝජනා ක්‍රමය යටතේද, මෙම සමස්තයෙන් හෙක්ටයාර් 170,000ක් මධ්‍යම හා සුළු වාරිමාර්ග යෝජනා ක්‍රමය යටතේද වගා කෙරේ (IWMI, 2005). ඉතිරි හෙක්ටයාර් 171,000, එනම් වාරි ජලය නොලැබෙන කුඹුරු ඉඩම් කුඩා පරිමාණ වී ගොවීන් විසින් වර්ෂා පෝෂිත වගාව යටතේ වපුරනු ලැබේ.

## ශ්‍රී ලංකාවේ ආර්ථික අර්බුදය වී ගොවිතැනට බලපා ඇති ආකාරය

ශ්‍රී ලංකාව කෘෂිකාර්මික රටක් වන අතර එහි භූමියෙන් තුනෙන් එකක් කෘෂිකර්මාන්තය සඳහා භාවිතා කරයි. එය රුපියල් මිලියන 237411ක දළ දේශීය නිෂ්පාදිතයට දායකත්වයක් සපයන අතර එය

ඨකියාවලින් 37%ක් නිර්මාණය කර තිබේ (Razmy & Ahmed, 2005). ශ්‍රී ලංකාවේ වී වගාව රට පුරාම ව්‍යාප්ත වූ කෘෂිකාර්මික ක්ෂේත්‍රයකි. තනි බෝගයක් ලෙස වී වගාවට වැඩි බිම් ප්‍රමාණයක් යොදවා ඇති අතර එය ශ්‍රී ලංකා භූමි ප්‍රමාණයෙන් 42% කි. ශ්‍රී ලංකාවේ වැඩිම වී වගා බිම් ප්‍රමාණයක් හඳුනාගත හැක්කේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ වන අතර අඩුම බිම් ප්‍රමාණයක් හඳුනාගත හැක්කේ නුවරඑළිය දිස්ත්‍රික්කයේය. වියළි කලාපයේ ගොවි ජනපදකරණය හේතුවෙන් කුඹුරු ඉඩම් සංඛ්‍යාව ඉහළ යාමෙන් වී නිෂ්පාදන හෙක්ටයාර් ප්‍රමාණය වැඩි වී තිබේ. හෙක්ටයාර් 431455 සිට හෙක්ටයාර් 990190 දක්වා වසර තිස්පහක් තුළ 130%කින් වැඩි වී තිබේ (Razmy & Ahmed, 2005).

ශ්‍රී ලංකාවේ වී වගාව වර්ෂා ජලයෙන් මෙන්ම වාරිමාර්ග ක්‍රම ඔස්සේ ජලය ලබා ගෙන සිදුකරන අතර කන්න දෙකකට අනුව වගා කරයි. වාරිමාර්ග ක්‍රම සුළු වාරි මාර්ග හා මහා වාරිමාර්ග යනුවෙන් කොටස් දෙකක් යටතේ හඳුනාගත හැකිය. සුළු වාරිමාර්ග යටතේ වගා කරන කුඹුරු ඉඩම් ප්‍රමාණය මුළු කුඹුරු ඉඩම් ප්‍රමාණයෙන් 22.06%ක් වන අතර මහා වාරිමාර්ග ක්‍රම යටතේ මුළු කුඹුරු ඉඩම් ප්‍රමාණයෙන් 23.4%ක් වගා කරනු ලබයි (Razmy & Ahmed, 2005). තෙත් කලාපයේ උස් බිම් කුඹුරු බොහෝ දුරට සුළු වාරිමාර්ග ක්‍රමය යටතේ පවත්වන අතර වියළි කලාපයේ ජල අර්බුදය හේතුවෙන් මහා වාරිමාර්ග ක්‍රම යටතේ වැඩි වශයෙන් සිදු කරයි ( Yoshino & Suppiah, 1984). අප්‍රේල් සිට සැප්තැම්බර් දක්වා යල කන්නය ලෙසත්, ඔක්තෝම්බර් සිට මාර්තු දක්වා මහ කන්නයත් වශයෙනි. යැපුම් කෘෂිකර්මාන්තයට අයත් වන වී වගාව ශ්‍රී ලංකාවේ ප්‍රධාන කලාප තුනක සිදුවේ. එනම් පහතරට වියළි කලාපය, පහතරට තෙත් කලාපය, කඳුරට බිම් වශයෙනි. එසේම ශ්‍රී ලංකාවේ වී වගාව තැනිතලා බිම්වල මෙන්ම හෙල්මළු ක්‍රමයට ද

සිදුකරන අතර දේශගුණය අනුව සලකා බලන කල වී වගාව සඳහා යෝග්‍යම ප්‍රදේශය වශයෙන් වියළි කලාපය හඳුනාගත හැකිය. පැළ සිටුවීම, වී වැපිරීම යන ක්‍රම ඔස්සේ ශ්‍රී ලංකාවේ වී වගාව සිදු කරයි.

ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවල කුඹුරු විවිධ නම්වලින් හඳුන්වා දී තිබේ. අකරහ කුඹුරු, අගාර කුඹුරු, අගම්පඩි කුඹුරු, අග්‍රහාර, අටවරල, උතු කුඹුරු, ඔවිලාන්, කරමාරු කුඹුරු, ගම්පංගුව ආදිය ඇතුළත්ව නම් රාශියකින් හඳුන්වනු ලැබේ. වී වගාව තුළ දී යොදාගන්නා වී වර්ග ද විවිධ වෙයි. රත්දැල්, සුවඳැල්, කළු හීනටි, මා වී, කුරුලුතුඩ, මඩතවාලු ඇතුළු ශ්‍රී ලංකාවටම ආවේණික වූ වී වර්ග 3500 ඉක්මවූ ප්‍රමාණයක් පැවත තිබේ. අස්වැන්න ලබා ගැනීමට ගත වන කාලය ඉහළ වීම හා අස්වැන්න අඩු වීම වැනි හේතු සාධක මත වර්තමානය වන විට මෙම පැරැණි වී වර්ග වගා කිරීමෙන් ඉවත් වී නව දෙමුහුන් වී වර්ග ඒ වෙනුවට වගා කිරීම සිදුකරයි. ශ්‍රී ලංකාවේ ගොවිතැන හා බැඳුණු සමාජ ආචාර විධි මෙන්ම ක්‍රීඩා ඇතුළු විවිධ ක්‍රියාකාරකම් හඳුනාගත හැකිය. ලංකාවේ අතීතයේ පටන් වර්තමානය වන තෙක්ම වී ගොවිතැන තුළ සමුපකාර ක්‍රමය හෙවත් අත්තම් ක්‍රමය නොනැසී පවතින බව හඳුනාගත හැකිය. මෙහිදී මුදලට සේවය සැපයීමකින් තොරව එකිනෙකා වෙනුවෙන් උදව් කිරීම සිදුවේ. ශ්‍රී ලංකාවේ වී ගොවිතැන චිත්‍ර කර්මය හා බැඳී පැවති බවට සාක්ෂි පවතී. සිංහලයා පළමුවෙන්ම සිතියම් අඳින ලද්දේ කමතේය. වංකගිරිය, නයිදරණය, අටමගල යනාදිය ඇඳීම මේ තුළ සිදුවිය. ඒවා ඇඳ දෙවියන් කන්නලව් කිරීම සිදුවිය (විමලකීර්ති හිමි, 2002). එසේම ගොවිතැන හා බැඳුණු නෘත්‍යක් ද හඳුනාගත හැකිය. ගොවිතැන් කටයුතු තාලයකට අනුව සිදුකරන ලද අතර එය සිංහල තාල ශාස්ත්‍රයට අනුග්‍රහය සපයන ලදි (විමලකීර්ති හිමි, 2002). එසේම වී ගොවිතැන හා බැඳුණු ඖෂධ භාවිතයක් ද පැවතිණි. තණහාල්, හී වැලේ ඇලුණු මඩ ආදිය බෙහෙත් සඳහා වී ගොවිතැන ආශ්‍රයෙන් යොදාගනී.

කමත හා බැඳුණු ආචාර විධි, ජන ක්‍රීඩා මෙන්ම නෘත්‍යය, සෞඛ්‍යය ආදී සෑම අංශයක් ඔස්සේ ම වී ගොවිතැන සමාජය හා බැඳී පවතී.


**ශ්‍රී ලංකාවේ වී නිෂ්පාදනය**

ප්‍රධාන වශයෙන් වී නිෂ්පාදනය කෙරෙහි ස්වභාවික සාධක ලෙස ගංවතුර, නියඟය වැනි අංශ බලපෑම් කරනු ලබයි ( Yoshino & Suppiah, 1984). වියළි කලාපයේ ප්‍රධාන වී නිෂ්පාදනය කරන කන්නය, මහ කන්නය වන අතර තෙත් කලාපයේ කන්න අනුව වී නිෂ්පාදනයේ වැඩි වෙනසක් හඳුනාගත නොහැක. ශ්‍රී ලංකාවේ වී නිෂ්පාදනය පිළිබඳ තක්සේරු කිරීම මෙන්ම ප්‍රතිපත්ති සකස් කිරීම දුර්වල මට්ටමක පවති (Razmy & Ahmed, 2005).

වී නිෂ්පාදනය තීරණය වීමට විවිධ සාධක බලපා තිබේ. වපුරන ප්‍රමාණය, අස්වනු ප්‍රමාණය සහ සාමාන්‍ය අස්වැන්න වෙනස් වීම නිසා එක් එක් වර්ෂයේ සහ කන්නයේ වී නිෂ්පාදනය උච්චාවචනය වී තිබේ (Razmy & Ahmed, 2005). වී වගාව උපනතියක් වශයෙන් මහ කන්නයේ අස්වැන්න යල කන්නයේ අස්වැන්නට වඩා 5%ක ප්‍රමාණයක් වැඩි වශයෙන් හඳුනාගත හැකිය. ඊට යල කන්නය සහ මහ කන්නය සඳහා බලපානු ලබන වර්ෂාපතන කාල සීමාවන් හේතු සාධක වේ ( Yoshino & Suppiah, 1984). වී වගාවේ නිෂ්පාදනය කෙරෙහි වර්ෂාපතනය, උෂ්ණත්වය, සූර්ය කිරණ, වාෂ්පීකරණය, සුළඟ සහ සාපේක්ෂ ආර්ද්‍රතාව වැනි අංශ බලපානු ලබයි. වර්ෂාපතනය සෘණාත්මක මට්ටමක පැවතීම මෙන්ම ඉහළ මට්ටමක පැවතීම වී නිෂ්පාදනය කෙරෙහි සෘණාත්මකව බලපානු ලබයි. මහා කන්නයේ ඇතිවන ධාරානිපාත වර්ෂාව වී නිෂ්පාදනය කෙරෙහි සෘණාත්මක ලෙස

බලපානු ලබයි. අධික වර්ෂාව හේතුවෙන් කුඹුරු යට වීමෙන් වී අස්වැන්න ලබා ගැනීමට නොහැකි මට්ටමකට පත්වේ. කොළඹ, ගාල්ල, මාතර, කළුතර ආදී තෙත් කලාපීය දිස්ත්‍රික්කවල කුඹුරුවල මේ තත්ත්වය වැඩි වශයෙන් හඳුනාගත හැකිය. වී නිෂ්පාදනය කෙරෙහි ඉහළ උෂ්ණත්වයක් අවශ්‍ය වේ. 20°c ට වැඩි හා 35° - 40° අඩු උෂ්ණත්වයක් පැවතීම අවශ්‍ය වේ (Yoshino & Suppiah, 1984). සමාජ ආර්ථික සාධක ද වී නිෂ්පාදනය කෙරෙහි බලපානු ලබයි. ශ්‍රී ලංකාවේ වී නිෂ්පාදනය විවිධ වර්ෂවල විවිධ මට්ටම්වලින් විචලනය වීමක් හඳුනාගත හැකිය. එය පහත ප්‍රස්තාරය ආශ්‍රයෙන් පැහැදිලි කරගත හැකිය.

**ප්‍රස්තාරයඃ ශ්‍රී ලංකාවේ වී නිෂ්පාදනය (මෙට්‍රික් ටොන් දහස්)**




මූලාශ්‍රයඃ ශ්‍රී ලංකා මහ බැංකුව, 2021

ශ්‍රී ලංකාවේ වී වගාව දළ දේශීය නිෂ්පාදිතයට දක්වන දායකත්වය ද විවිධ වර්ෂවල වෙනස් වෙමින් ගමන් ගන්නා ආකාරයක් හඳුනාගත හැකිය. ඒ අනුව 2014 - 2019 කාලය තුළ පවත්නා

වෙළෙඳපොළ මිල අනුව වී වගාව දළ දේශීය නිෂ්පාදිතය සඳහා දක්වන දායකත්වය පහත පරිදි හඳුනාගත හැකිය.

**වගුව: 2014 - 2019 කාලය තුළ( පවත්නා වෙළෙඳපොළ මිල අනුව) වී වගාව දළ දේශීය නිෂ්පාදිතය සඳහා දක්වන දායකත්වය**

| වර්ෂය | දළ දේශීය නිෂ්පාදිතය (රුපියල් මිලියන) |
|---|---|
| 2014 | 100931 |
| 2015 | 118098 |
| 2016 | 72811 |
| 2017 | 88565 |
| 2018 | 132726 |
| 2019 | 114420 |

මූලාශ්‍රයඃ ශ්‍රී ලංකා මහ බැංකුව, 2021


ශ්‍රී ලංකාවේ ප්‍රාථමික ආර්ථික ක්‍රියාකාරකමක් වන වී වගාව මුල් කාලීනව යැපීම් බෝගයක් වශයෙන් පමණක් වගා කළද වර්තමානය වන විට එය වෙළඳ භෝගයක් බවට පත් වී දේශීය ආර්ථිකයට ඉහළ දායකත්වයක් සපයයි. වී ගොවිතැන සඳහා තරුණ ප්‍රජාවගේ දායකත්වය අවම මට්ටමක පවතින අතර පාරම්පරික උරුමය මත බොහෝ පිරිසක් මෙම වී වගාව තම ජීවනෝපාය මාර්ගය බවට පත්කරගෙන තිබේ. මෙම වී නිෂ්පාදනය ග්‍රාමීය මෙන්ම ජාතික වශයෙන් ආර්ථික මට්ටම තීරණය කිරීමටත් දළ දේශීය ආදායම තීරණය කිරීමටත් බලපානු ලබයි. වී නිෂ්පාදනය වී වගාකරුවන්ගේ ආර්ථිකය, සමාජ මට්ටම තීරණය කිරීමට බලපානු ලබන බැවින් මෙම අධ්‍යයනය තුළින් ඉහත ආකාරයට පවතින ශ්‍රී ලංකාවේ වී නිෂ්පාදනය කෙරෙහි ආර්ථික අර්බුදය බලපාන

ආකාරයත් එය වී වගාකරුවන්ගේ සමාජ, ආර්ථික පසුබිම කෙරෙහි බලපාන ආකාරයත් පෙන්වා දී තිබේ.

## වී වගාවට උඩවළව පළාතේ දායකත්වය

ගොවිතැන සම්බන්ධයෙන් වෙල්ලස්ස හෙවත් කොටුසර වශයෙන් හැඳින්වූ උඩවළව පළාත නම් දරා ඇත (විමලකීර්ති හිමි, 2002). මෙම ප්‍රදේශයේ වැඩි පිරිසකගේ ජීවන වෘත්තිය වශයෙන් වී වගාව හඳුනාගත හැකි අතර වාරිමාර්ග ක්‍රම යටතේ මෙන්ම වර්ෂා ජලය භාවිතයෙන් ද වී වගාවේ නිරතවනු ලබයි. උඩවළව පළාත අතීතයේ පටන් ම වී වගාව සඳහා ඉහළ වැදගත්කමක් මෙන්ම ප්‍රසිද්ධියක් උසුලන අතර ගොවි පවුල් ලක්ෂ දෙකක් පමණ වාසය කරයි. උඩවළව පළාතේ ඉඩම් වලින් 8%ක්ම භාවිතා කරනු ලබන්නේ වී වගාව සඳහාය. එය අනෙක් වගාබිම් සමඟ සසඳන කල ඉහළ අගයක් ගනියි.

**ප්‍රස්තාරයඃ උඩවළව පළාතේ ඉඩම් භාවිතය**




මූලාශ්‍රය : උඩවළව පළාත් ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව, 2021

ජාතික වී නිෂ්පාදනයෙන් 8%ක් පමණ ම නිෂ්පාදනය කරන්නේ ඌව පළාතේ වී වගාවෙන් වීම විශේෂ වේ. පවත්නා වෙළෙඳපොළ මිල අනුව 2017 වසරේ දී පමණක් ඌව පළාතේ වී වගාව මගින් සිදුකල දළ දේශීය නිෂ්පාදිතය රුපියල් මිලියන 7484කි. එම වසරේ වී වගාවෙන් වූ දළ දේශීය නිෂ්පාදිතය වන රුපියල් මිලියන 88564 න් රුපියල් මිලියන 7484ක් ම නිෂ්පාදනය කර තිබෙන්නේ ඌව පළාතේ වී වගාව මගිනි (මහ බැංකු වාර්තා, 2020). 2016 දී ඌව පළාත තුල වී වගාවෙන් දළ දේශීය නිෂ්පාදිතයට රුපියල් මිලියන 5583 ක දායකත්වයක් ලබා දී තිබේ. ඌව පළාතේ වී නිෂ්පාදනය පිළිබඳ විමසා බලන කල 2014 සිට 2018 දක්වා වර්ෂවල ක්‍රමයෙන් ඉහළ පහළ බසින විචලනයක් හඳුනාගත හැකිය.

**වගුව: 2014-2018 ඌව පළාතේ වී නිෂ්පාදනය**

| වර්ෂය | වගා කළ ශුද්ධ බිම් ප්‍රමාණය (හෙක්ටයාර දහස්) | ඵලදාව (හෙක්ටයාරයකට කිලෝ ග්‍රෑම්) | වී නිෂ්පාදනය (මෙට්‍රික් ටොන් දහස්) |
|---|---|---|---|
| 2014 | 64.8 | 4457 | 289.0 |
| 2015 | 86.5 | 4388 | 379.5 |
| 2016 | 82.4 | 4178 | 344.4 |
| 2017 | 46.2 | 4354 | 201.2 |
| 2018 | 69.4 | 4227 | 293.2 |


මූලාශ්‍රයඃ ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, 2021

ඌව පළාත තුළ හෙක්ටයාරයකට වී නිෂ්පාදනය ඉහළ මට්ටමක පවති. ජාතික වී නිෂ්පාදනයට වාර්ෂිකව මෙට්‍රික් ටොන් ලක්ෂ දෙක ඉක්මවා ඌව පළාතේ වී නිෂ්පාදනය මගින් එක් කරනු ලබයි. මේ අනුව බලන කළ ඌව පළාතේ වී වගාව සංවර්ධනීය මට්ටමක පවතින බව පැහැදිලි කරගත හැකිය.

**පර්යේෂණ ක්‍රමවේදය**

**අධ්‍යයන ප්‍රදේශය**


අධ්‍යයන ප්‍රදේශය වශයෙන් තෝරා ගත් බඩල්කුඹුර ප්‍රාදේශීය




ලේකම් කොට්ඨාසය ඌව පළාතේ මොනරාගල දිස්ත්‍රික්කයට අයත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස එකොළහෙන් එකකි. බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඌව පලාතේ මොනරාගල දිස්ත්‍රික්කයේ බටහිර දෙසට මායිම්ව පිහිටා ඇත. වර්තමානය වන විට ග්‍රාමය නිලධාරී වසම් 41 කින් සමන්විත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ විශාලත්වය හෙක්ටයාර 25480.01 වේ. **සිතියම : බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටීම**

අධ්‍යයනයේ දී නියැදි ප්‍රදේශය වශයෙන් තෝරාගත් බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ කටුගහගල්ගේ ග්‍රාම නිලධාරී වසමේ පිහිටීම පහත පරිදි හඳුනාගත හැකිය.

**සිතියම: බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ නියැදි ප්‍රදේශයේ පිහිටීම.**




## නියැදිය තෝරාගැනීම

බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ග්‍රාම නිලධාරි වසම් 41 කින් සමන්විත වන අතර මුළු ජනගහනය 50332ක් වේ. එහි මුළු පවුල් සංඛ්‍යාව 15860 කි. නියැදි ප්‍රදේශය වන කටුගහගල්ගේ ග්‍රාම නිලධාරී වසමෙහි ජන සංඛ්‍යාව ද ස්ත්‍රී පුරුෂ වශයෙන් කොපමණ ප්‍රමාණයක් ද යන්න වගුව ඇසුරෙන් පැහැදිලි වේ.

**වගුව: ජන සංඛ්‍යාව**

| | මුළු ජනගහනය | ස්ත්‍රී | පුරුෂ | පවුල් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | 50332 | 25774 | 24558 | 15860 |
| කටුගහගල්ගේ ග්‍රාම නිලධාරී වසම | 2196 | 1164 | 1032 | 540 |

මූලාශ්‍රය: බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, 2023


එහිදී අධ්‍යයන ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී වසම් 41න් ප්‍රධාන වශයෙන් වී ගොවිතැන ජීවනෝපාය මාර්ගය කරගත් කටුගහගල්ගේ ග්‍රාම නිලධාරී වසමේ වී වගාකරුවන් සංගහනය වශයෙන් තෝරා ගන්නා ලදී. සංගහනය වන මුළු වී ගොවි පවුල් සංඛ්‍යාව 139කි. මෙමගින් නියැදිය තෝරා ගැනීම සඳහා සම්භාවිතා නියැදි ක්‍රමය යටතේ සරල අහඹු නියැදිය තෝරාගෙන ඉන් සමස්ථ ජනගහනයෙන් 25%ක නියෝජනයක් ලෙස නියැදිය සකසකර ගන්නා ලදී.

කටුගහගල්ගේ ග්‍රාම නිලධාරී වසමේ වී ගොවි පවුල් සංඛ්‍යාව = 139

=139×25÷100 =34.75 ඒ අනුව සමස්ථ නියැදිය ලෙස වී ගොවි පවුල් 35ක් යොදාගන්නා ලදි.

### වගුව: බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ආදායම් මාර්ගය අනුව පවුල් බෙදීයාම

| ආදායම් මාර්ගය | මුළු පවුල් සංඛ්‍යාව |
|---|---|
| ගොවිතැන | 7807 |
| රාජ්‍ය අංශය | 2267 |
| පෞද්ගලික අංශය | 2077 |
| තාවකාලික රැකියා | 1735 |
| ස්වයං රැකියා | 1254 |




මූලාශ්‍රය: බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, 2023

**අධ්‍යයන සොයාගැනිම් සහ සාකච්ඡාව**

**ශ්‍රී ලංකාවේ ආර්ථික අර්බුදය වී ගොවින්ට බලපා ඇති ආකාරය සහ මුහුණ පා ඇති ගැටලු**

ශ්‍රී ලංකාවේ මෑතකාලීන ආර්ථික අර්බුදයක් නිර්මාණය වීම සමග කෘෂි කර්මාන්තය මුලිකකරගනිමින් සිදුවු ප්‍රතිපත්තිමය වෙනස්කම් හේතුවෙන් විශාල ගැටලු රැසකට මුහුණදිමට වි ගොවියන්ට සිදුවිය. ආර්ථික අර්බුදය සමග කාබනික පොහොර භාවිතය සහ රාසයනික පොහොර ආනයනය නැවැත්වීම හා තහනම් කිරීමේ ප්‍රතිපත්තිය ප්‍රධාන වශයෙන් වි ගොවිතැනට බලපාන ලද අතර පසුව පොහොර වෙළඳපොලට නිකුත් කළ ද පොහොර මිලකරන ප්‍රතිපත්තිය යටතේ එම අර්බුදය තවදුරටත් දීර්ඝ වීම සිදුවිය. එය ශ්‍රී ලංකාවේ පොහොර මූලික කරගනිමින් සිදුවන වාණිජමය වී ගොවිතැන කෙරෙහි බලපෑම් එල්ල කරන ලදී.

## වී ගොවිතැන සිදුකරන පවුල්

අධ්‍යයන ප්‍රදේශය වශයෙන් තෝරා ගත් බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය වී ගොවිතැන ප්‍රධාන ආර්ථික ක්‍රියාකාරකමක් වශයෙන් සිදු කරන ප්‍රදේශයක් වශයෙන් හඳුනාගත හැකිය. මෙම බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ග්‍රාම නිලධාරී වසම් අතරින් ද කටුගහගල්ගේ ග්‍රාම නිලධාරී වසම වී ගොවිතැන ප්‍රධාන ජීවනෝපාය කරගත් පවුල් වැඩි ප්‍රමාණයක් වෙසෙන ප්‍රදේශයක් වශයෙන් හඳුනාගත හැකිය. ඒ හේතුවෙන් මෙම අධ්‍යයනය සඳහා කටුගහගල්ගේ ග්‍රාම නිලධාරී වසම පසුබිම් කරගනු ලැබීය. ඒ අනුව මෙම කටුගහගල්ගේ ග්‍රාම නිලධාරී වසම තුළ වී ගොවිතැනෙහි නිරත පවුල් සංඛ්‍යාව පහත පරිදිය.

**වගුව: වී ගොවිතැනෙහි නිරත වන පවුල් සංඛ්‍යාව**

| කටුගහගල්ගේ ග්‍රාම නිලධාරී වසමේ මුළු පවුල් සංඛ්‍යාව | කටුගහගල්ගේ ග්‍රාම නිලධාරී වසමේ වී ගොවිතැනෙහි නිරත පවුල් සංඛ්‍යාව | වී ගොවිතැනෙහි නිරත ප්‍රතිශතය |
|---|---|---|
| 234 | 139 | 59.4% |

මූලාශ්‍රය: බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,2023

එහිදී නියැදිය ලෙස තෝරාගත් පවුල් (35) තුළ සාමාජිකයන් ප්‍රමාණය ද මෙම ප්‍රදේශයේ වී ගොවිතැන කෙරෙහි බලපානු ලබයි. නියැදියේ සමාජික සංඛ්‍යාව වගුවෙන් දැක්වේ.

**වගුව: පවුලේ සාමාජිකයන් සංඛ්‍යාව**

| පවුලේ සාමාජිකයන් සංඛ්‍යාව | පවුල් සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| 1 - 2 | 3 | 8.571% |
| 3 - 4 | 26 | 74.285% |
| 5 - 6 | 5 | 14.285% |
| 6 ට වැඩි | 1 | 2.857% |
| එකතුව | 35 | 99.7% |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2023

පවුල් සංඛ්‍යාව ද වී ගොවිතැනෙහි ක්‍රියාවලියට බලපානු ලබයි. ශ්‍රමය අවශ්‍ය වන වී ගොවිතැන සඳහා පවුලක සිටින සංඛ්‍යාව ප්‍රමුඛ වශයෙන් වැදගත් කොට සැලකිය හැකිය. මෙම ප්‍රදේශයේ පවුල් සංඛ්‍යාව විමසා බලන විට (5.2) වගුව අනුව වැඩිම පවුල් සංඛ්‍යාවක සාමාජිකයන් සංඛ්‍යාව (3-4) මට්ටමේ පවතී. එය මුළු ප්‍රමාණයෙන් (74.285%) තරම් ඉහළ ප්‍රමාණයකි. පවුලේ සාමාජිකයන් සංඛ්‍යාව 6ට වැඩි එක් පවුලක් පමණක් පවතින අතර එහි දරුවන් සංඛ්‍යාව ඉහළ වේ. එය පසු කාලීනව වී ගොවිතැනෙහි ප්‍රගමනයට හේතු විය හැකිය. වැඩිම පවුල් ප්‍රමාණයක් නියෝජනය කරන පවුලේ සාමාජිකයන් ගණන 3-4 වන විට පවුලේ දුවා දරුවන් ප්‍රමාණය උපරිම දෙකකට හෝ තුනකට සීමා වූ තත්ත්වයක් හඳුනා ගත හැකිය. එය වී ගොවිතැනෙහි ශ්‍රම සැපයීමට පවුල තුළින් වන දායකත්වය අතීතයට සාපේක්ෂව අවප්‍රමාණ වීමකි.

පවුලක සාමාජිකයන් ගණන මෙන්ම ඔවුන්ගේ වයස් ප්‍රමාණය ද මෙම ප්‍රධාන ආර්ථිකමය වී ගොවිතැන කෙරෙහි හේතුවේ. සේවය සැපයීමට හැකි පිරිස් වැඩි වශයෙන් සිටීම වී ගොවිතැනෙහි ශ්‍රමය සපයා ගැනීම හා ඒ ඔස්සේ වී ගොවිතැනෙහි කාර්යභාරය පහසු කරවා ගැනීමට හේතුවේ.

## ආර්ථික අර්බුදය තුළ වර්ධනය වු පොහොර අර්බුදය හා වී නිෂ්පාදනය


වාණිජමය වශයෙන් සිදුකරන වී ගොවිතැනෙහි අස්වැන්න ඉහළ මට්ටමක පවත්වා ගැනීම සඳහා රසායනික පොහොර භාවිතය ඉහළ මට්ටමක පවත්වා ගැනීම අත්‍යවශ්‍ය වන මට්ටමට වර්තමානය වන විට පත්ව තිබේ. වී අස්වැන්නෙහි ප්‍රමාණය තීරණය වීමට ප්‍රධාන වශයෙන් වගාව සඳහා යොදන රසායනික පොහොර ප්‍රමාණය බලපානු ලබයි.

හරිත විප්ලවය හේතුවෙන් 1960 දශකයෙන් පසුව ශ්‍රී ලංකාවේ ඉහළ කෘෂි රසායනික පොහොර භාවිතයක් හඳුනාගැනීමට හැකි විය. ඒ හේතුවෙන් අතීතයේ දී හෙක්ටයාරයකට භාවිතා කරන ලද කෘෂි රසායනික පොහොර ප්‍රමාණයට වඩා ඉහල පොහොර ප්‍රමාණයක් මෙම අවධියෙන් පසුව වී වගාව සඳහා යොදා ගෙන තිබේ (විජේබණ්ඩාර, (2004). වී වගාවේදී පසේ සාරවත්භාවය ඉහල මට්ටමකට පත් කර ගැනීමටත්, ඵලදාව වැඩි කරගැනීමටත්, ශාක වර්ධනය ඉහළ මට්ටමක පවත්වා ගැනීමටත් පොහොර භාවිතා කරයි. දේශීය වී වගාව තුළ කාබනික පොහොර හා රසායනික පොහොර යන දෙවර්ගයම භාවිතා කරන අතර ඉන් වැඩි පරිභෝජනයක් ඇත්තේ රසායනික පොහොර වේ. නයිට්‍රජන්, පොස්ෆරස්, පොටෑසියම් ලෙස මෙම කෘෂි රසායනික පොහොර භාවිතා කරන අතර ඒ අතරිනුත් නයිට්‍රජන් අඩංගු යූරියා භාවිතය ඉහළ මට්ටමක පවතී (විජේබණ්ඩාර, (2004).

ශ්‍රී ලංකා රජය මගින් 2021 අප්‍රේල් මාසයේ සිට රසායනික පොහොර ආනයනය කිරීම තහනම් කළ අතර ඒ වෙනුවට කාබනික පොහොර ප්‍රතිපත්තියක් ඇති කිරීමට කටයුතු කරන ලදී. 2021 අප්‍රේල් 21 වන දින ගෙන එන ලද මෙම තහනම 2021 මැයි 6 වන දින මුදල් අමාත්‍යාංශය විසින් පළ කරන ලද ගැසට් පත්‍රයක් මගින් නීතියක් බවට පත්විය (අබේසිංහ ,2021). ඒ මත වී වගාවට ප්‍රබල තර්ජනයක් එල්ල විය. පොහොර තහනමෙන් දීර්ඝ කාලයකට පසුව වුවද පොහොර මිලකරණය යටතේ වී වගාකරුවන්ට අපේක්ෂිත පොහොර ප්‍රමාණය මිලදී ගැනීමේ ගැටලු මතුවීම හේතුවෙන් වී නිෂ්පාදනය පහළ වැටීමට එය හේතු සාධක වී තිබේ.

2021 වසර තුළ පොහොර හා අනෙකුත් කෘෂි රසායන ද්‍රව්‍යවල සැපයුමෙහි අඩුවීම හේතුවෙන් 2020 වසරේ යල, මහ කාල පරිච්ඡේදවලට සාපේක්ෂව 2020 (/2021) මහ කන්නය 2021 යල කන්නයේ වී එලදාව පිළිවෙලින් හෙක්ටයාරයකට කිලෝ ග්‍රෑම් 4492ක් දක්වා (6.8%) කින් සහ හෙක්ටයාරයකට කිලෝ ග්‍රෑම් (4692) දක්වා (1.6%) කින් අඩුවිය (ශ්‍රී ලංකා මහ බැංකුව, 2021). ශ්‍රී ලංකාව තුළ රසායනික පොහොර තහනම් කිරීමේ ප්‍රතිපත්තිය හේතුවෙන් මෙලෙස සෘජුවම වී නිෂ්පාදනය කෙරෙහි බලපෑම් ඇති කර තිබේ. පොහොර අර්බුදයට පෙර හා පසු වී නිෂ්පාදනයේ වෙනස ප්‍රස්තාරය මගින් හඳුනාගත හැකිය.

**ප්‍රස්තාරයः පොහොර අර්බුදය නිෂ්පාදනයට බලපෑම**




මූලාශ්‍රයः ශ්‍රී ලංකා මහ බැංකුව,2021

පොහොර නිකුත් කිරීම අවම මට්ටමකට පත් වීම ප්‍රධාන වශයෙන්ම වී නිෂ්පාදනයට බලපාන බව අධ්‍යයන ප්‍රදේශය වන බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙහි පොහොර නිකුත් කිරීමේ හා වී අස්වැන්න පිළිබඳ දත්ත හා සසඳා බලන විට හඳුනාගත හැකිය. ගොවීන්ට ප්‍රධාන වශයෙන් පොහොර සහනාධාර ලබාදීම වී නිෂ්පාදනය ඉහළ මට්ටමකට පවත්වා ගැනීමට හේතුවේ. නමුත් පොහොර අර්බුදය හේතුවෙන් ගොවිජන සේවා මධ්‍යස්ථානය මගින් පොහොර නිකුත් කිරීම ඊට පෙර වසරවලට සාපේක්ෂව අඩු මට්ටමකින් සිදු කරන තත්ත්වයක් හඳුනාගත හැකිය. පහත වගුව මගින් බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වී වගාව සඳහා රසායනික පොහොර නිකුත් කිරීමේ ප්‍රමාණයන් හඳුනාගත හැකිය.

**වගුව: බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පොහොර නිකුත් කිරීම.**

| කන්නය | යූරියා)මෙ(ටොන්. | TSP (මෙ. ටොන් ( | MOP (මෙ. ටොන් ( | එකතුව |
|---|---|---|---|---|
| 2019 යල | 55.859 | 14.60 | 16.026 | 86.485 |
| 2019/20 මහ | 95.622 | 24.58 | 27.260 | 147.462 |
| 2020 යල | 81.063 | 13.40 | 22.588 | 117.051 |
| 2020/21 මහ | 100.11 | 13.60 | 22.873 | 136.583 |
| 2021 යල | 62.98 | 7.24 | 22.418 | 92.638 |
| 2021/22 මහ | 21.9 | - | 11.412 | 33.312 |
| 2022 යල | - | - | - | - |
| 2022/23 මහ | 76.942 | - | 4.516 | 81.458 |

මූලාශ්‍රය : ගොවිජන සේවා මධ්‍යස්ථානය, 2023

මෙහිදී වී නිෂ්පාදනය පොහොර අර්බුදයත් සමග අඩු වී ඇති ආකාරය Justus von Liebig ගේ Low of the minimum (අවමකිරණයේ නීතිය) ඔස්සේ යමින් ද හඳුනාගත හැකිය. මෙම නීතියට අනුව අත්‍යවශ්‍ය ශාක පෝෂ්‍ය තත්වය ඌන නම්, අනෙකුත් පෝෂ්‍ය පදාර්ථ බහුල වුවද ශාක වර්ධනය දුර්වල වන බව දක්වයි. පොහොර මිළකරණය හා පොහොර හිගය ඇතුළු පොහොර අර්බුදය හේතුවෙන් වී වගාව සඳහා

භාවිතා කරන පොහොර ප්‍රමාණය අඩුවීමක් හඳුනාගත හැකිය. එය වී නිෂ්පාදනය දුර්වල කිරීමට හේතු වන බව මේ අනුව පැහැදිලි කරගත හැකිය. වී අස්වැන්න කෙරෙහි හේතු වන සාධක අතරින් ප්‍රධාන සාධකයක් වන පොහොර භාවිතය ඍණාත්මක මට්ටමක පැවතීමෙන් වී නිෂ්පාදන ප්‍රමාණය ඍණාත්මක වේ. වගුව මගින් වී ගොවීන් (35) දෙනෙකු පොහොර අර්බුදයට පෙර හා පසු පොහොර භාවිතා කිරීමේ සිදු වූ වෙනස හඳුනාගත හැකිය.

**වගුවඃ පොහොර අර්බුදයට පෙර හා පසු පොහොර භාවිතය**

| **පොහොර ප්‍රමාණය)kg)** | **පොහොර අර්බුදයට පෙර පොහොර භාවිතය** | | **පොහොර අර්බුදයට පසු පොහොර භාවිතය** | |
|---|---|---|---|---|
| | ගොවින් ගණන | ප්‍රතිශතය | ගොවින් ගණන | ප්‍රතිශතය |
| 0-50 | - | - | 15 | 42.85% |
| 50-100 | 3 | 8.57% | 16 | 45.71% |
| 100-150 | 7 | 20% | 3 | 8.57% |
| 150-200 | 7 | 20% | - | - |
| 200-250 | 5 | 14.28% | - | - |
| 250-300 | 5 | 14.28% | 1 | 2.85% |
| 300ට වැඩි | 8 | 22.85% | - | - |
| එකතුව | 35 | 99.98% | 35 | 99.98% |

මූලාශ්‍රයඃ ක්ෂේත්‍ර සමීක්ෂණය, 2023

පොහොර භාවිතය අඩුවීම හේතුවෙන් සිදු වූ අස්වැන්නෙහි වෙනස වගුව මගින් හඳුනාගත හැකිය.

**වගුව: පොහොර අර්බුදය ට පෙර හා පසු ගොවීන්ගේ වී අස්වැන්න (kg)**

| වී අස්වැන්න )Kg) | පොහොර අර්බුදයට පෙර වී අස්වැන්න | | පොහොර අර්බුදයට පසු වී අස්වැන්න | |
|---|---|---|---|---|
| | ගොවින් ගණන | ප්‍රතිශතය | ගොවින් ගණන | ප්‍රතිශතය |
| 0-3000 | 7 | 20% | 25 | 71.42% |
| 3000-6000 | 20 | 57.14% | 6 | 17.14% |
| 6000-9000 | 7 | 20% | 4 | 11.42% |
| 9000ට වැඩි | 1 | 2.85% | - | - |
| එකතුව | 35 | 99.99% | 35 | 99.98% |

මූලාශ්‍රයඃ ක්ෂේත්‍ර සමීක්ෂණය, 2023

ප්‍රාදේශීය වී ගොවීන් ප්‍රධාන වශයෙන් වාණිජමය වී වගාව තුළදී රසායනික පොහොර භාවිතා කරයි. ඊට සහයක යෙදවුමක් ලෙසත් අතිරේකයක් වශයෙනුත් කාබනික පොහොර සුළු ප්‍රමාණයක් භාවිතා කරනු ලබයි. එහිදී විවිධ පුද්ගලයන් කාබනික අපද්‍රව්‍යල ශාක කොටස් ආදී විවිධ දෑ කාබනික පොහොර වශයෙන් භාවිතා කිරීම සිදු කරයි. එහිදී ප්‍රධාන වශයෙන් පිදුරුල ග්ලීරසීඩියාල ගොමල කුකුල් අපද්‍රව්‍යල කෙසෙල් බඩ හා පතුරු කාබනික පොහොර වශයෙන් සුළු පරිමාන වලින්

වී වගාව සඳහා භාවිතා කරනු ලබයි (ක්ෂේත්‍ර සමීක්ෂණය 2023). පොහොර අර්බුදයට පෙර ප්‍රධාන වශයෙන් රසායනික පොහොරත්, අවශේෂ වශයෙන් කාබනික පොහොරත් භාවිතයක් සිදු කළ ද භාවිතයත් සිදුකළද, පොහොර අර්බුදය හා පසුකාලීන රසායනික පොහොර මිලකරනය හමුවේ ප්‍රධාන වශයෙන් කාබනික පොහොර වැඩි ප්‍රමාණයක් භාවිතා කිරීම සඳහා යොමුවිය. වගුව මගින් නියැදි ප්‍රදේශය ආශ්‍රිතව පොහොර අර්බුදයට පෙර හා පසු කාබනික පොහොර භාවිතා කිරීමේ ස්වරූපය හඳුනා ගත හැකිය.

**වගුව: පොහොර අර්බුදය ට පෙර හා පසු කාබනික පොහොර භාවිතය**

| **කාබනික පොහොර ප්‍රමාණය )Kg)** | **පොහොර අර්බුදයට පෙර කාබනික පොහොර භාවිතය** | | **පොහොර අර්බුදයට පසු කාබනික පොහොර භාවිතය** | |
|---|---|---|---|---|
| | භාවිතා කරන ගොවින් ගණන | ප්‍රතිශතය | භාවිතා කරන ගොවින් ගණන | ප්‍රතිශතය |
| 0-100 | 11 | 37.93% | 3 | 9.67% |
| 100-200 | 8 | 27.58% | 5 | 16.12% |
| 200-300 | 6 | 20.68% | 8 | 25.80% |
| 300-400 | - | - | 2 | 6.45% |
| 400-500 | 3 | 10.34% | 7 | 22.58% |
| 500ට වැඩි | 1 | 3.44% | 6 | 19.35% |
| එකතුව | 29 | 99.97% | 31 | 99.97% |

මූලාශ්‍රයඃ ක්ෂේත්‍ර සමීක්ෂණය, 2023

නියැදි ප්‍රදේශයේ කාබනික පොහොර භාවිතා කරන පිරිස පොහොර අර්බුදයට පෙර පැවති තත්ත්වයට වඩා පොහොර අර්බුදයෙන් පසු වර්ධනය වීමක් හඳුනාගත හැකිය.

අධ්‍යයන ප්‍රදේශය වශයෙන් තෝරාගත් බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ රසායනික පොහොර අර්බුදයට පිළියමක් හා ආදේශකයක් වශයෙන් කාබනික පොහොර භාවිතයට යොමුවී තිබේ. ඒ ඔස්සේ වී වගාවට, මානව සෞඛ්‍යයට සිදුවූ බලපෑම නියැදිය ආශ්‍රයෙන් හඳුනාගත හැකිය. රජය මගින් සහනාධාර ලෙස ලබාදෙන පොහොර භාවිතයේ දී මුහුණ දීමට සිදුවන විවිධ ගැටලු හඳුනා ගත හැකිය.

"ගොයම් පැළ කාලෙට යෙදීම අපහසු ය. රසායනික පොහොර තරම් සරු බවක් නෑ. කාබනික පොහොර වැඩි ප්‍රමාණයක් ඒ නිසා යෙදීමට වෙනවා." (පුරුෂ - 42)

මෙම කාබනික පොහොර, ඝන පොහොර හා දියර පොහොර වශයෙන් ලබා දීම සිදු කරයි. ඝන පොහොර ගොයම් පැළ සිටුවීමට පෙර පමණක් භාවිතා කිරීමට හැකියාව පවතී. ගොයම් පැළ සිටුවීමෙන් පසු ඝන පොහොර භාවිතා කලහොත් ගොයම් පැල යටවීම, ගොයම් පැළ මැරීම, ගොයම් පැළ බිඳ වැටීම ආදී ගැටලු ඇතිවේ. නමුත් වී වගාවට සිටුවීමට පෙර යොදන පොහොර පමණක් ප්‍රමාණවත් නොවේ. ගොයම් පැළ විවිධ අවධියේ පවතින විට එහි පෝෂණ තත්වය හා වර්ධනය නඟාසිටුවීමට අදාල කාල වකවානුවලදී පොහොර යෙදීම අත්‍යවශ්‍ය වේ. බණ්ඩි ගොයමේ සිට කිරි වැදුණු ගොයම දක්වා ඉහළ පොහොර අවශ්‍යතාවයක් පෙන්නුම් කරයි. මෙම කාබනික පොහොර රසායනික පොහොර තරම් වී වගාවේ වර්ධනයට හේතු නොවන නිසා වැඩි වශයෙන් කාබනික පොහොර යෙදීම සිදුවේ. නමුත් අත්‍යවශ්‍යතාවය තෘප්ත කිරීමට හැකි වන සේ කාබනික පොහොර ද යෙදීමට අපහසු වේ.

ඊට හේතුව මෙම පොහොර භාවිතා කළ හැකි වන්නේ පැළ සිටුවීමට පෙර පමණක් වීම හේතුවෙනි. එබැවින් මෙම කාබනික පොහොර මඟින් වී ගොවිතැන වර්ධනයට ප්‍රමාණවත් තරම් පෝෂණයක් ලබා නොදීම ගැටළුවකි. ලබාගත් නියැදියට අනුව කාබනික පොහොර භාවිතා කිරීම තුලින් වී නිෂ්පාදනය ඉහළ මට්ටමකට නඟාසිටුවීමට රුකුලක් නොලැබෙන නිසා ගොවි පවුල් (35) ට අයත් කුඹුරු ඉඩම් වල වී නිෂ්පාදනය පහත වැටී තිබේ (ක්ෂේත්‍ර සමීක්ෂණය,2023). එය මෙම කාබනික පොහොර භාවිතය හා සම්බන්ධව හඳුනාගත හැකි ගැටලුවකි. මෙම රජය මගින් සහනාධාර වශයෙන් ලබාදෙන කාබනික පොහොර වී නිෂ්පාදනය කෙරෙහි තවත් ගැටලුකාරී බලපෑම් ඇතිකරනු ලබයි.

"අස්වැන්න ඉතාම පහළ මට්ටමක පවතී. ගොයම් කහ පැහැ ගැන්වෙයි. නිසි වේලාවට පොහොර නොලැබෙයි" (ස්ත්‍රී -56)

මෙම කාබනික පොහොර භාවිතා කිරීම තුළ රසායනික පොහොර භාවිතා කරන විට මෙන් වී නිෂ්පාදනය ඉහළ යාමක් හඳුනාගත නොහැකිය. මේ තුළින් අස්වැන්න අඩුවීම හඳුනාගත හැකිය. ඊට අමතරව මෙම කාබනික පොහොර භාවිතයෙන් ගොයම් කහ පැහැයට හැරීම ප්‍රධාන ගැටලුවකි. එය ගොයමේ වර්ධනයට සෘණාත්මක අයුරින් බලපානු ලබයි. එසේම වී ගොවිතැනේ දී නිසි කාල වකවානුව තුළ පොහොර යෙදීම අවශ්‍ය වේ. ගොයම් පැළ අවධියේ, බණ්ඩි ගොයම් අවධියේ, වී ඉසින අවස්ථාව ඇතුළු විවිධ කාල වකවානුවලදී නියමිත කාලයට පොහොර යෙදීම වී වගාවේ වර්ධනයට හේතු වේ. නමුත් මෙම කාබනික පොහොර සහනාධාරය නිසි කලට නොලැබීම හේතුවෙන් වී වගාවට අවශ්‍ය කාල වකවානු අනුව පොහොර යෙදීමේ ගැටළු පවතී. එය මගින් වී නිෂ්පාදනය පහත වැටීම සිදුවේ. එය ප්‍රධාන ගැටලුවකි.

එසේම මෙම පොහොර කාබනික අපද්‍රව්‍ය හා ජෛව අපද්‍රව්‍ය භාවිතා කරමින් නිපදවීම හේතුවෙන් ද එම පොහොර භාවිතා කිරීමෙන් වී වගාවට වන බලපෑම ඉහළ මට්ටමක පවතී.

"දුර්ගන්ධය හේතුවෙන් වගාවට සතුන්ගෙන් බාධා එල්ලවීම හා කුඹුරු ඉඩම ගොඩ වීම සිද්ධ වෙනවා"(පුරුෂ - 60)

මෙම කාබනික ඝන පොහොර, දියර පොහොර හා ජෛව දියර පොහොර දුගඳින් යුක්ත වීම ද ගැටලුවකි. එම පොහොර භාවිතා කළ විට එම පොහොර වලින් දැනෙන දුගදට බල්ලන්, තලගොයන්, කබරගොයන් වැනි සතුන් වගාවට පැමිණීම සිදුවේ. එවිට වගාවේ ගොයම් පැළ පොඩි වීම ඇතුළුව වගාවට හානි සිදු වේ. එසේම මෙම කාබනික ඝන පොහොර යනු කාබනික පස් වේ. ඒවා වී ගොවිතැනට භාවිතා කිරීම තුළ කුඹුරු ඉඩම් ගොඩ වීම සිදුවේ. එය කාබනික පොහොර භාවිතය ආශ්‍රිත ගැටලුවකි.

මෙම රජය මගින් ලබාදෙන කාබනික පොහොර භාවිතය තුළ සෞඛ්‍යමය ගැටලු ද හඳුනාගත හැකිය. කාබනික පොහොර නිෂ්පාදනය කිරීමේදී සත්ව වසුරු, කාබනික අපද්‍රව්‍ය ආදිය භාවිතා කිරීම නිසා එම කාබනික පොහොර භාවිත කරන්නන්ට විවිධ සෞඛ්‍යමය ගැටලු ඇතිවී තිබේ.

"එම පොහොර පාවිච්චි කිරීමේදී අත් තුවාල වෙනවා.කකුලේ නියපොතු වණවීම, දුර්ගන්ධය නිසා වමනය, ඔලුව රිදීම සිද්ධ වෙනවා" (පුරුෂ - 56)

සත්ව අපද්‍රව්‍ය හා කාබනික ද්‍රව්‍ය යොදා නිපදවන රජයේ සහනාධාර කාබනික පොහොර වල ඇතිවන දිලීර, බැක්ටීරියා ඇතුළු විෂබීජ හේතුවෙන් ඒවා අතින් ඇල්ලීමේදී අත් තුවාල වීම, එම පොහොර කුඹුරුවලට යෙදීමේදී පාදවල නියපොතු වණවීම ආදී අහිතකර සෞඛ්‍ය

බලපෑම් ඇතිවේ. එසේම සත්ව අපද්‍රව්‍ය ආදිය හේතුවෙන් එම පොහොරවල පවතින දුර්ගන්දය හේතු කොටගෙන ඒවා භාවිතා කරන ගොවීන්ට වමනය, හිසේ කැක්කුම් ආදී රෝගී තත්ත්වයන් ඇතිවී තිබේ. මෙම ඝන හා දියර කාබනික පොහොර භාවිතා කිරීම තුළ ආර්ථිකමය වශයෙන් අලාභ හානි සිදු වීම, වී නිෂ්පාදනය පහළ වැටීම, වගාවට සතුන්ගෙන් වන බලපෑම්, දුර්ගන්ධය, ගොයම කහ පැහැවීම, කුඹුරු ඉඩම් ගොඩ වීම වැනි ගැටලුත් අත්පා තුවාලවීම, වමනය, හිසේ කැක්කුම ආදී සෞඛ්‍ය ගැටලු ද ඇති වේ. මේ අයුරින් රසායනික පොහොර වෙනුවට භාවිතා කරන කාබනික පොහොර භාවිතා කිරීම තුළ තුළ විවිධ ගැටලුවලට මුහුණ දීමට සිදුවේ.

පොහොර සහනාධාරය පිළිබඳ වී ගොවීන් විවිධ ආකල්ප දරයි.

"පොහොර සහනාධාරය ලබාදීම වී වගාවට අවශ්‍යයි. ගොවීන්ට වැඩි මිලට පොහොර ලබාගන්න බැරි නිසා වී අස්වැන්න අඩු වී තියෙනවා. ඊට පිලියමක් විදියට පොහොර සහනාධාරය ලබා දිය යුතුයි" (පුරුෂ-62)

රසායනික පොහොර මිලකරණය හේතුවෙන් වී නිෂ්පාදනයේ යෙදෙන ආර්ථික මට්ටම අඩු වී ගොවීන්ට වගාවට අවශ්‍ය පොහොර ප්‍රමාණවත් පරිදි ලබාගැනීමට නොහැකි වේ. එයට විසඳුමක් ලෙස වී ගොවීන් පොහොර සහනාධාරය අපේක්ෂා කරන අතර ඒ තුළින් තම වී නිෂ්පාදනය ඉහළ මට්ටමකට පවත්වා පවත්වා ගැනීම අපේක්ෂා කරයි. ආර්ථික මට්ටම අඩු, වී ගොවීන්ට සහනාධාර මිල යටතේ පොහොර ලබාදීම මගින් ඔවුන්ට අවශ්‍ය අතිරේක පොහොර ප්‍රමාණය පමණක් වැඩි මිලට ලබා ගැනීමට හැකිවේ. පොහොර සහනාධාරය ලබාදීම සම්බන්ධයෙන් වී ගොවීන්ගේ යහපත් ප්‍රතිචාර මෙන්ම විවේචනද

හඳුනාගත හැකිය. ක්ෂේත්‍ර අධ්‍යයනය මගින් ලබාගත් තොරතුරු අනුව ඔවුන් පොහොර සහනාධාරය පිළිබඳව විවිධ අදහස් දරයි.

"වැඩසටහන හොඳයි. නමුත් ක්‍රමානුකූලව නොකෙරෙයි. මේ නිසාත් ගොයමට නිසි කලට අවශ්‍ය පොහොර ප්‍රමාණය නොලැබෙයි." (ස්ත්‍රී - (56)

පොහොර සහනාධාරය ලබා දීම සෑම ගොවියෙක්ම තම වී අස්වැන්න ඉහළ මට්ටමකට පවත්වා ගැනීමට වැදගත් වන බව හඳුනාගෙන තිබේ. නමුත් මෙම වැඩසටහන ආශ්‍රිතව දුර්වල කළමනාකාරීත්ව ගැටලු ද පවතින බව හඳුනාගෙන තිබේ. ක්‍රමානුකූලව නිසි කාලයට පොහොර ලබා නොදීමත්, පොහොර සහනාධාරය ප්‍රමාදවී ලබාදීමත් වැනි ගැටලු හේතුවෙන් ගොයමට නිසි කලට අවශ්‍ය පොහොර නොලැබීම ගැටලුවක් වශයෙන් පොහොර සහනාධාරය ආශ්‍රිතව හඳුනාගෙන තිබේ.

"පොහොර සහනාධාරය ලබා දීමෙන් හොඳට වී වගාව පවත්වා ගන්න පුළුවන් වගේම වී අස්වැන්න ඉහළ වේ. පොහොර සහනාධාරය නොමැතිවීමෙන් පොහොර භාවිතා කරන ප්‍රමාණය අඩුවීම හේතුවෙන් අස්වැන්න අඩු වේ."(පුරුෂ-53)

පොහොර සහනාධාරය ප්‍රාදේශීය වී ගොවීන්ගේ වී වගාව නගා නඟාසිටුවීමට වැදගත් කාර්යභාරයක් ඉටු කරන බව අධ්‍යයනය කරන ලද තොරතුරු අනුව පැහැදිළි වේ. පොහොර සහනාධාරය ලබාදීම හෝ නොදීම මත ගොවීන් වගාවට යෙදෙන පොහොර ප්‍රමාණය තීරණය වේ. පොහොර සහනාධාරය නොලැබී යාමෙන් වගාවට භාවිතා කරන පොහොර ප්‍රමාණය අඩුවීම නිසා එය වී අස්වැන්න පහත හෙළීමට හේතු වී තිබේ. වී ගොවීන්ගේ අධ්‍යයන ආශ්‍රයෙන් ලබාගත් තොරතුරු අනුව වී ගොවීන් බහුතරයකගේ අදහස පොහොර සහනාධාරය ලබාදීම

ප්‍රයෝජනවත් බවයි. ඇතැම් පුද්ගලයින් ඊට ප්‍රතිවිරුද්ධව අදහස් දරනු ලබයි.

"සහනාධාරය අවශ්‍ය නොමැත. පහසු මිලකට මිලදී ගැනීම සඳහා වෙළඳපොලට පොහොර ලබා දිය යුතුය."(පුරුෂ - 62)

ඇතැම් පුද්ගලයින් පොහොර සහනාධාරය ලබා ගැනීමට අපේක්ෂා නොකරන බව අධ්‍යයන ප්‍රදේශය ආශ්‍රිතව සිදුකරන ලද සමීක්ෂණ තුළින් හඳුනා ගැනීමට හැකි විය. ඒ වෙනුවට ඔවුන් අපේක්ෂා කරන්නේ ප්‍රමාණවත් තරම් පොහොර මිලදී ගත හැකි මට්ටමකට පොහොර මිල අඩුකර වෙළඳපොළට පොහොර නිකුත් කළ යුතු බවයි. එමගින් අඩු මුදලකට තමන්ට වගාවට ප්‍රමාණවත් තරම් පොහොර ගැටලුවකින් තොරව ලබා ගැනීමට හැකි වන බව පවසයි.

"අපිට පොහොර සහනාධාර උවමනා නැහැ. ඒත් බෙහෙත් පොහොර උවමනා වෙලාවට කඩවල් වල මිල දී ගැනීමට තියනව නම් හොඳයි. පොහොර සහනාධාරය දුන්නත් ඉතා අඩු ප්‍රමාණයක් තමයි ගොවියන්ට ලබා දෙන්නේ."(පුරුෂ - 42)

අධ්‍යයනය තුළින් ඇතැම් ගොවීන් පොහොර සහනාධාරය අපේක්ෂා නොකරන බව හඳුනාගත හැකිය. පොහොර සහනාධාරය අඩු ප්‍රමාණයක් ලබාදීම නිසා පොහොර සහනාධාර අපේක්ෂා නොකරන අතර ඒ වෙනුවට වෙළෙඳපොළ ක්ෂේත්‍රය පොහොර හා ඖෂධ වලින් පූර්ණය කිරීම අපේක්ෂා කරයි.

මේ අයුරින් ගොවීන් පොහොර සහනාධාරය තම වී වගාව නගා සිටුවීමට අවශ්‍ය සම්පතක් ලෙස මෙන්ම, ප්‍රමාණවත් නොවීම නිසාම නොවැදගත් ක්‍රියාවලියක් ලෙසත් හඳුනා ගනී. ක්ෂේත්‍ර සමීක්ෂණය තුළින් පොහොර සහනාධාරය ආශ්‍රිත ගැටලු ද හඳුනාගත හැකිය. එනම් ක්‍රියාවලිය නිසි ආකාරයට සිදු නොවීම, ප්‍රමාණවත් තරම් පොහොර

ප්‍රමාණයක් නොලැබීම ආදී ගැටලු පොහොර සහනාධාරය ලබාදීම ආශ්‍රිතව පවතින බව අධ්‍යයන ප්‍රදේශ ආශ්‍රිතව ගොවීන්ගේ අදහස් අනුව පෙනෙයි. මෙම පොහොර සහනාධාරය ලබාදීම පිළිබඳ ධනාත්මක මෙන්ම ඍණාත්මක ආකල්ප ද ගොවීන් තුළ පවතින බව හඳුනාගත හැකිය.

පොහොර අර්බුදයත් සමග වී නිෂ්පාදනය අඩු වීම මෙම පිරිසගේ ආර්ථික මට්ටම පසුබෑමට ලක් වීමට හේතු වේ. පොහොර අර්බුදයත් සමග වී නිෂ්පාදනය පහළ වැටීම මෙම ආදායම් මට්ටම පහත දැමීමට හේතුවේ. පොහොර අර්බුදයෙන් පසු වී නිෂ්පාදනය පහත වැටීමත් සමඟ ආදායම් තත්ත්වයේ අඩුවීමක් ද හඳුනාගත හැකිය. වගුව මගින් ආදායම් මට්ටමේ අඩුවීම නියැදිය ආශ්‍රයෙන් හඳුනාගත හැකිය.

| අඩු වූ ආදායම් ප්‍රමාණය (රුපිල්ය) | ගොවීන් ගණන | ප්‍රතිශතය |
|---|---|---|
| 25000-50000 | 4 | 11.42% |
| 50000-100000 | 14 | 40% |
| 10000-150000 | 9 | 25.7% |
| 150000-200000 | 6 | 17.14% |
| 200000-250000 | 2 | 5.71% |
| එකතුව | 35 | 99.98% |

| වී අස්වැන්න )Kg) | පොහොර අර්බුදයට පෙර වී අස්වැන්න | | පොහොර අර්බුදයට පසු වී අස්වැන්න | |
|---|---|---|---|---|
| | ගොවින් ගණන | ප්‍රතිශතය | ගොවින් ගණන | ප්‍රතිශතය |
| 0-3000 | 7 | 20% | 25 | 71.42% |
| 3000-6000 | 20 | 57.14% | 6 | 17.14% |
| 6000-9000 | 7 | 20% | 4 | 11.42% |
| 9000ට වැඩි | 1 | 2.85% | - | - |
| එකතුව | 35 | 99.99% | 35 | 99.98% |

මූලාශ්‍රය: ක්ශේත්‍ර සමීක්ෂණය, 2023

ශ්‍රී ලංකාවේ මෑත කාලීනව ඇති වූ පොහොර අර්බුදය වී ගොවිතැන වෙත ඍජු බලපෑම් එල්ල කරන ලදී.රසායනික පොහොර තහනමත්, පසුව ඇති වූ රසායනික පොහොර මිලකරණය හේතුවෙන් පොහොර භාවිතයේ දී වැයවන පිරිවැය වැඩිවීමත් හඳුනාගත හැකිය. ඒ හේතුවෙන් වී ගොවිතැන ආශ්‍රිතව සියලුම ප්‍රපංචයන්ට හිමිවූ වටිනාකම ඉහළ ස්ථලයක පැවතිණි. පොහොර අර්බුදයට පසු පොහොර මිල ඉහළ යාම නිසා වී ගොවිතැනට භාවිතා කරන පොහොර ප්‍රමාණය අඩු වීම සිදුවිය. එය වී නිෂ්පාදනය පහත වැටීමට හේතු විය (ක්ෂේත්‍ර සමීක්ෂණය,2023). ඒ හේතුවෙන් ඉතා අඩු අස්වැන්නක් වී වගාව තුලින් ලැබුණු අතර ඒ හේතුවෙන් බිත්තර වී ඇතුළු අනෙකුත් ප්‍රපංචවල ද මිල ඉහළ යන ලදී. එය වී ගොවීන්ගේ ආර්ථික තත්වය කෙරෙහි ප්‍රබලවම බලපානු ලබයි. වී ගොවිතැනේ දී පොහොර සඳහා වැයවන මිල

ඉහළයාම වී ගොවීන්ගේ ආර්ථික මට්ටම දුර්වල කිරීමට හේතු වී ඇති බව හඳුනාගත හැකිය.

වී ගොවිතැන සම්බන්ධ අනෙකුත් සියලුම ක්‍රියාකාරකම්හි වියදම් ඉහළ යාම වී වගාකරුවන්ගේ ආර්ථිකයට සෘණාත්මක බලපෑම් එල්ල කරන්නකි. අධ්‍යයන ප්‍රදේශය ආශ්‍රිතව වී ගොවීන්ට වී වගා කිරීමට බිම් සකස් කිරීමේ සිට වී වැපිරීම, පොහොර යෙදීම, අස්වනු නෙළීම දක්වා වූ සෑම ක්‍රියාවලියකටම වැයවන පිරිවැය ඉහළ යාම නිසා පොහොර අර්බුදය සමග වී නිෂ්පාදනය අවම වීමෙන් ආර්ථිකය බිඳ වැටුණු වී වගාකරුවන්ට එම වියදම් දැරීමට නොහැකි වේ. අධ්‍යයන ප්‍රදේශය ආශ්‍රිත ගොවීන්ගේ ප්‍රකාශ මගින් එය තහවුරු වේ. නියැදිය වශයෙන්තෝරාගත් පවුල් තිස්පහෙහිම වී වගාකරුවන්ට පොහොර අර්බුදය සමඟ අස්වැන්න අඩුවීම නිසා වී වගා කිරීමේ සිට අස්වනු නෙළීම දක්වා වැයවන පිරිවැය ගෙවීම අර්බුදකාරී තත්ත්වයකට පත්ව ඇති බව හඳුනාගැනීමට හැකි විය (ක්ෂේත්‍ර සමීක්ෂණය, 2022).

"ඔව් පෝරු ගෑම, බිත්තර වී මිලදී ගැනීම, අස්වනු නෙළීම සඳහාත් දැන් වන විට පෙර මෙන් දෙගුණයක් පමණ මුදල් අවශ්‍ය වී තිබේ. දැන් වී අස්වැන්න අර්ධයකින් පමණ අඩු වී ඇති නිසා වී විකුණා එම පිරිවැය ගෙවීමට නොහැකි වී තිබේ." (පුරුෂ- 56)

මෙම ප්‍රකාශ අනුව වී වගාවේ නිෂ්පාදනය පොහොර අර්බුදය සමඟ අර්ධයකින් පමණ පහළ බැසීම නිසා වී විකුණා වී වගාව සඳහා අවශ්‍ය වන පිරිවැය ගෙවන පුද්ගලයන්ට එම මුදල් ගෙවීමේදී ගැටලු පැන නැගී ඇත. වී අස්වැන්න පහළ යාම නිසා පරිභෝජනයට අවශ්‍ය වී ප්‍රමාණය ඉතිරි කර අනෙකුත් වී ප්‍රමාණය විකුණා මෙම පිරිවැය ගෙවීම අපහසු වී ඇත. වී නිෂ්පාදනය පහළ යෑමත්, පිරිවැය වැඩි වීමත් නිසා එම පිරිවැය ගෙවීමේදී අර්බුධකාරී තත්වයන්ට පත්ව තිබේ. ඒ අයුරින්

වියදම් වැඩිවීම නිසා ඔවුන් එම වියදම් පියවීමට ණය හා උකස් තැබීම වැනි වෙනත් ක්ෂේත්‍ර වෙත යොමුවීම ඔවුන්ගේ ආර්ථික මට්ටම පහළ හෙළීමට හේතුවේ.

"අස්වැන්න අඩු වීමත්, බෙහෙත්, පොහොර, ඉන්ධන මිල වැඩි වීමත්, යන්ත්‍ර උපකරණ මිල වැඩි වීමත් සහ මිනිසුන්ගේ කුලිය වැඩිවීම ගොවියාට දරා ගැනීමට අපහසුයි." (පුරුෂ -42)

ප්‍රධාන වශයෙන්ම පොහොර අර්බුදය හේතුවෙන් වී වගාවේ අස්වැන්න අඩුවීම නිසා වී වගාව ආශ්‍රිතව සෑම කාර්යයක්ම මිල ඉහළ ගොස් තිබේ. වී නිෂ්පාදනය ප්‍රධාන ජීවන වෘත්තිය කරගත් වී වගාකරුවන්ට වී නිෂ්පාදනය පහළ යාමෙන් තම ආදායම් ප්‍රමාණය අඩුවී තිබේ. ඒ හා සමගම පොහොර මිල ඉහළ යාම නිසා පොහොර මිලදී ගැනීමට නොහැකිවීමත්, යන්ත්‍ර වලට අය කරන මිල ගෙවීමට නොහැකිවීම, ජීවන වියදම් වියදම ඉහළ යාම නිසා මිනිස් ශ්‍රමය ඉහළ යාම හේතුවෙන් වී ගොවිතැනට අවශ්‍ය එම ක්ෂේත්‍ර යොදා ගැනීමේදී ගැටලු ඇතිවේ. එය චක්‍රාකාරව වී නිෂ්පාදනය අඩු වීමට, වී ගොවීන් ණය කරුවන් වීමට, වී ගොවීන්ගේ ආර්ථික මට්ටම පහළ යාමට හේතු වේ. පොහොර අර්බුදය සමග වී අස්වැන්න අඩුවීම වී වගාවට වැයවන පිරිවැය ගෙවීමට අපහසු කරවන බව නියැදි ප්‍රදේශයේ ගොවීන්ගේ ප්‍රකාශ තුළින් තවදුරටත් හඳුනාගත හැකිය.

"ඔව් පෙර අස්වැන්න නෙලීමට රුපියල් (10000) ක් පමණ වැයවුවත් වර්තමානයේ එය 30000ක් බවට පත් වී තිබේ. සියලු වගා කටයුතු වල මිල ඉහළ ගොස් තිබේ. එය ගෙවීමට අපහසු වී තිබේ." (පුරුෂ - 53)

ඉහත ප්‍රකාශය අනුව පොහොර අර්බුදයට පෙර හා පසු අස්වනු නෙලීමේදී වැයවන මිල වෙනස් වී ඇති බව පැහැදිලිව හඳුනාගත හැකිය. පොහොර අර්බුදයට පෙර වී අස්වනු නෙලීමට රුපියල් 10000ක පමණ මුදලක් වැය වූවත් පසුව පොහොර අර්බුදය සෑම අංශයකටම බලපෑම් කිරීම නිසා ආර්ථික අර්බුද පැමිණීම හේතුවෙන් පසුව අස්වනු නෙලීම සඳහා රුපියල් 30000ක පමණ මුදලක් වැය වී තිබේ. එය වී නිෂ්පාදනය පහළ වැටුණු අනෙකුත් ආර්ථික ක්‍රියාකාරකම් සඳහා ද විශාල මුදලක් වැය වන පුද්ගලයකුට ගෙවීමට අපහසු ය. වී නිෂ්පාදනය අඩුවීම නිසා ආර්ථික අර්බුදයත් සමග වී ගොවිතැන ආශ්‍රිත ව සෑම ක්‍රියාවලියකම මිල ඉහළයාම සිදු වී තිබේ. එය වී ගොවීන්ගේ ආර්ථිකයට ඍණාත්මක බලපෑම් එල්ල කරන්නකි.

"ඔව් බිත්තර වී මිලදී ගැනීමත්, රොටරි කිරීම, අස්වනු නෙලීම ආදිය පෙර සිදු කරන ලද්දේ වී අස්වැන්නෙන් යම් ප්‍රමාණයක් විකුණා ලැබෙන මුදලිනි. වර්තමානයේ වී අඩුවීම නිසා එය සිදු කිරීමට අපහසු වී තිබේ." (පුරුෂ - 47)

උක්ත ප්‍රකාශය අනුව ද පැහැදිලි වන්නේ පොහොර අර්බුදය හේතුවෙන් වී නිෂ්පාදනය පහළ තත්ත්වයකට පත්වීම හා විකුණා එම මුදලින්ම කෘෂිකාර්මික කටයුතු සිදුකරන වී වගාකරුවන්ට එම කෘෂිකාර්මික කටයුතු සඳහා අවශ්‍ය වන පිරිවැය ගෙවීමට අපහසු වී තිබේ. මේ අයුරින් පොහොර අර්බුදයෙන් පසු කෘෂිකාර්මික කටයුතු සඳහා වන පිරිවැය ඉහළ යාම ද වී ගොවීන්ගේ ආර්ථිකය තුළ පසුගාමී තත්වයක් ඇති කිරීමට හේතුවී තිබේ.

**විධිමත් හා අවිධිමත් ණය ලබා ගැනීම**

මෑතකාලීනව ආර්ථික අර්බුදයත් සමග තම වගා කටයුතු, දෛනික කටයුතු සඳහා අවශ්‍ය මූල්‍යමය පහසුකම් සපයා ගැනීමේ

ගැටලුවක් වී වගාකරුවන්හට ඇති වී තිබේ. පොහොර අර්බුදය හේතුවෙන් වී නිෂ්පාදනය පහළ යාම නිසා තම දෛනික කටයුතු ඇතුළු විවිධ කාර්යයන් සඳහා ණය ලබා ගැනීමට සිදුවී තිබේ. එහිදී විධිමත් හා අවිධිමත් ප්‍රවේශ යටතේ ණය ලබාගැනීමට වී වගාකරුවන් පෙළඹී ඇත. අධ්‍යයන ප්‍රදේශයේ ද වී වගාකරුවන් මෙම පොහොර අර්බුදයත් සමග වී වගා කටයුතු, නේවාසිකව ඉදිකිරීම්, අධ්‍යාපන ඇතුළු දෛනික ජීවිතයේ කටයුතු සඳහා ණය ලබාගෙන තිබේ. වගුව මගින් නියැදිය වශයෙන් තෝරා ගත් පිරිස පොහොර අර්බුදය හමුවේ ණය ක්ෂේත්‍ර වෙත යොමු වී ඇති ප්‍රමාණය හඳුනාගත හැකිය.

**වගුව: ආර්ථික අර්බුදය හමුවේ ණය ලබා ගැනීම**

| **ණය ලබාගත්තා ද? නැද්ද? යනවග** | **ගොවීන් ගණන** | **ප්‍රතිශතය** |
|---|---|---|
| ඔව් | 28 | 80% |
| නැත | 7 | 20% |
| එකතුව | 35 | 100% |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2023

මෙම පිරිස වී නිෂ්පාදනය පහළ වැටීමත් සමග විවිධ අරමුණු හේතුවෙන් විධිමත් හා අවිධිමත් ක්‍රම යටතේ ණය ලබා ගැනීමට පෙළඹී ඇත. ඒ අතරින් ද ණය ලබා ගැනීමේදී ඇති වන දුෂ්කරතා මගහරවා ගැනීමට අවිධිමත් ණය ලබා ගැනීමට බොහෝ පිරිසක් යොමු වී තිබේ. පොහොර අර්බුදය හමුවේ ලබාගත් ණය තවදුරටත් වී නිෂ්පාදනය අවම මට්ටමක පැවතීම හේතුවෙන් ගෙවීමේ අපහසුතා ඇති වී තිබේ. එය අධ්‍යයන ප්‍රදේශයේ ගොවීන්ගේ ප්‍රකාශ අනුව තහවුරු කරගත හැකිය.

"වගාවට අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා ණය වී ඇත. රත්‍රං බඩු උගස් කර ඇත. ඒවා නිදහස් කිරීමට අපහසු වී ඇත."(පුරුෂ-50)

ආර්ථික අර්බුදය සමඟ වී වගා කරුවන්ට තම වී වගාවට අවශ්‍ය පොහොර ලබා ගැනීමේ දුෂ්කරතා ඇතිවිය. පසුකාලීනව පොහොර මිලකරණය හේතුවෙන් ගොවීන්ට අවශ්‍ය පොහොර ප්‍රමාණය මිලදී ගැනීමට නොහැකි වීමෙන් භාවිතා කරන පොහොර ප්‍රමාණය අඩුවීම හේතුවෙන් වී අස්වැන්න පහළ වැටිණි. ඒ හේතුවෙන් වගාවට අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීමට වී වගාකරුවන්ට ණය ලබා ගැනීමට සිදුවී තිබේ. එහිදී ලබාගත් ණය නැවත ගෙවීමට අපහසු වීම වී නිෂ්පාදනය පහත වැටීම හමුවේ සිදු වී ඇත. ඊට අමතරව අවශ්‍ය මූල්‍යමය පහසුකම් සපුරා ගැනීම උදෙසා රත්රන් බඩු උකස් කිරීම නිසා වී අස්වැන්න අඩු වීමෙන් මූල්‍යමය තත්ත්වය ඉතා පහළ මට්ටමක පැවතීම හේතුවෙන් ඒවා නිදහස් කර ගැනීමේ ගැටලු මතුවී තිබේ. පොහොර අර්බුදය හේතුවෙන් ණය ලබා ගැනීම නිසා වී වගාකරුවන් ඒවා නැවත ගෙවීමට යාමේදී මූල්‍යමය අර්බුධකාරී තත්ත්වයට පත්ව තිබේ.

"ග්‍රාමීය සුභසාධක සමිතිය මගින් ණය ලබා ගත් අතර එහි පොලිය හා වාරික ගෙවීමට අපහසු වී තිබේ" (පුරුෂ - (52)

උක්ත ප්‍රකාශයට අනුව වී වගාකරුවන්ට සමිති සමාගම් ඇතුළු සුළු මූල්‍ය ආයතන ඔස්සේ ණය ලබාගෙන ඇති අතර ඒවායේ පොලිය ඉහළ මට්ටමක පැවතීම හේතුවෙන් එම ණය මුදල් හා පොලී මුදල් නැවත ගෙවීමේදී ගැටලුකාරී තත්වයන්ට පත්ව ඇත. මෙම ගොවින් ණය ලබාගන්නේ වී වගාවේ අස්වනු නෙලීමෙන් පසු අස්වනු විකුණා ණය ගෙවීමේ අපේක්ෂාවෙනි. පොහොර අර්බුදයත් සමගම වී නිෂ්පාදනය පහළ වැටීම නිසා වී විකුණා ලබාගන්නා මුදල දෛනික කටයුතුවලට

හෝ ප්‍රමාණවත් නොවන නිසා ණය වාරික ගෙවීමේ දුෂ්කරතා ඇති වී තිබේ.

"ආහාර හා එදිනෙදා අවශ්‍යතා සඳහා ණය ලබාගෙන ඇත.අවිධිමත් ලෙස ණය ලබා ගැනීම නිසා ඒවා ගිනි පොලී වී ඇත. (ස්ත්‍රී-49)

බැංකු මගින් ණය ලබා ගැනීමේදී විශාල නීතිරීති මාලාවක් හා ක්‍රියා පටිපාටියකට පසුව ණය ලබා ගැනීමට සිදුවීම නිසා බොහෝ ගොවින් වෙනත් ආයතන මගින් ණය ලබා ගැනීමට කටයුතු කර තිබේ. අවිධිමත් ප්‍රවේශය යටතේ ණය ලබා ගැනීම හේතුවෙන් ඒවායේ පොලිය වැඩිවීමත්, පොලිය නොගෙවීමෙන් වැල්පොලිය රැස් කිරීමත් නිසා ගොවීන් ණය ගෙවීමේ දුෂ්කරතාවන්ට මුහුණ දී තිබේ.

"ළමුන්ට අධ්‍යාපන කටයුතුවලට හා කුඹුරට අවශ්‍ය රසායනික පොහොර හා කෘමි නාශක ලබාගැනීමට ණය වී තිබේ. වී අස්වැන්න නෙලීමේ යන්ත්‍රවල ණය වී තිබේ. ඒවා පියවීමට තවත් ණය ගැනීමට සිදුවී තිබේ." (පුරුෂ - (47)

ආර්ථික මට්ටමට පහත වැටීම නිසා එය චක්‍රාකාරව ළමුන්ගේ අධ්‍යාපනයට බලපා තිබේ. ළමුන්ගේ අධ්‍යාපනයට අවශ්‍ය වියදම් සපයා ගැනීම සඳහා ණය ලබා ගැනීමට සිදුවී තිබේ. නමුත් වී නිෂ්පාදනය අවම මට්ටමක පැවතීම නිසා මෙම ලබාගත් ණය ගෙවීමේ අපහසුතා ඇති වී තිබේ.

"වගා කටයුතු වලට හා නේවාසික සංවර්ධනයට ණය ලබාගෙන ඇත. එය ලබා ගත්තේ වී අස්වනු නෙලීමෙන් පසු අස්වනු විකුණා ණය පියවීමට ය. නමුත් පොහොර අර්බුදය නිසා අස්වනු අඩු වීමෙන් ණය ගෙවීමට අපහසු වී ඇත." (පුරුෂ - 63)

වී ගොවීන් තම ආර්ථික කටයුතු සිදුකරන්නේ වී විකිණීම තුළින් ලැබෙන ලාභය ඔස්සේය. පොහොර අර්බුදය හේතුවෙන් වී අස්වැන්න

අඩුවීම නිසා ලාභයක් ලබා ගැනීමට නොහැකිව පවතී. ගොවීන් ඒ හේතුවෙන් වගා කටයුතුවලට අවශ්‍ය මුදල් සොයා ගැනීමට ණය ලබා ගැනීමට පෙළඹී තිබේ. එසේම මෙම ආර්ථික පසුබෑම හමුවේ වී ගොවීන් තම වගාවට අවශ්‍ය ණය මෙන්ම තම නේවාසිකව තත්ත්වයන් සංවර්ධනයට ලබාගත් ණය ගෙවීමට අපහසු වී ඇත. වී අස්වැන්න අඩුවීම නිසා වී විකුණා ණය පියවීමේ අරමුණින් ලබාගත් ණය ගෙවීමට අපහසු වී ඇත. මෙම ණය ලබාගැනීම හමුවේ පුද්ගල බද්ධ ගැටුම් ඇති වී තිබේ. එනම් ණය ලබාගත් පුද්ගලයන් හා ණය ලබාදුන් පුද්ගලයන් අතර, ඇපකරුවන් අතර ආදී වශයෙන් විවිධ ගැටුම් ඇතිවේ. අධ්‍යයන ප්‍රදේශය තුළ ද මෙවැනි තත්ත්වයක් හඳුනා ගත හැකිය.

**වෙනත් රැකියා සඳහා යොමුවිම සහ වී ගොවිතැන ආශ්‍රිත ශ්‍රම හිඟය**

ආර්ථික අර්බුදය- වී නිෂ්පාදනය පහත වැටීම වී ගොවීන්ගේ ආර්ථිකයට බලපාන ලද අතර එය සෘජුවම ඔවුන්ගේ සමාජ තත්වය කෙරෙහි බලපාන ලදී. පොහොර අර්බුදයත් සමග ආර්ථිකමය අස්ථාවර මට්ටමකට පත්වීම ප්‍රධාන වශයෙන් වී ගොවීන්ගේ සමාජ මට්ටම ද පහත වැටීමට බලපා තිබේ. වී ගොවිතැන ප්‍රධාන ජීවන වෘත්තිය කරගත් මෙම අධ්‍යයන ප්‍රදේශය ආශ්‍රිත වී වගාකරුවන් වී ගොවිතැනින් ඔබ්බට ගමන් කිරීමක් හඳුනාගත හැකිය.

**වගුවඃ පොහොර අර්බුදයෙන් පසු රැකියා වෙනස්වීම**

| රැකියාවේ ස්වරූපය | ගොවීන් ගණන | ප්‍රතිශතය |
|---|---|---|
| වී ගොවිතැනෙහි නියැලීම | 20 | 57.14% |
| වෙනත් රැකියාවක් සඳහා යොමුවීම | 3 | 8.57% |
| රැකියා විරහිත වීම | 12 | 34.28% |
| එකතුව | 35 | 99.99% |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2023

රැකියා විරහිත තත්ත්වයට පත්වීම සමාජීය ජීවිතය පවත්වාගෙන යාමේදී මූලික අවශ්‍යතා වල සිට සෑම අංශයක් කෙරෙහිම ගැටලු ඇතිකරවන්නකි. නියැදිය වශයෙන් තෝරාගත් පුද්ගලයින් පවුල් 35න් 12 ක්ම රැකියා විරහිත තත්ත්වයට පත්වීම යනු වර්තමාන ආර්ථික අර්බුදය හේතුවෙන් ඇතිවූ ප්‍රබල සමාජයීය පසුබෑමකි.

වී ගොවිතැන ජීවිකාව කරගත් ඉඩම් හිමි වී වගාකරුවන්ට පොහොර අර්බුදය සමඟ ආර්ථික මට්ටම පහළ වැටීම නිසා ඇතැම් අවස්ථාවලදී තම කුඹුරු ඉඩම් අඳයට වෙනත් පාර්ශවයන් වෙත ලබා ලබාදීම හඳුනාගත හැකිය. වගුව මගින් අධ්‍යයන ප්‍රදේශයේ වී ගොවීන් තම කුඹුරු ඉඩම් මෙරට මුහුණ පා ඇති ආර්ථික සහ කෘෂිකර්මාන්තයේ අර්බුදය හේතුවෙන් වෙනත් පාර්ශවයන් වෙත ලබාදීමේ ස්වරූපය හඳුනා ගත හැකිය.

**වගුවː කුඹුරු ඉඩම් වෙනත් පාර්ශවයන් වෙත ලබාදීම**

| ඉඩම පවත්වාගෙන යන ස්වරූපය | ගොවීන් ගණන | ප්‍රතිශතය |
|---|---|---|
| තනි අයිතිය යටතේ | 30 | 85.71% |
| බදු පදනම මත | 1 | 2.85% |
| අඳයට ලබාදීම | 4 | 11.42% |
| එකතුව | 35 | 99.98% |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය ,2023

## ආර්ථික දුෂ්කරතා හේතුවෙන් අධ්‍යාපනය සිදුවන බලපෑම සහ ළමා ශ්‍රමිකත්වය

ආර්ථික ගැටලු, විකුණුම් ගැටලු, වී නිෂ්පාදනය පහළ මට්ටමකට පත් වීම ඒ හේතුවෙන් වී වගාකරුවන්ගේ ආර්ථික මට්ටම පහත වැටීම සිදු විය. ආර්ථික මට්ටම පහත වැටීම මත සමාජීය ක්ෂේත්‍රවලට එය

ප්‍රබල වශයෙන් බලපාන ලදී. ආර්ථික මට්ටම පහත වැටීම නිසා සමාජයීය අංශවලට යෙදිය යුතු මුදල් ප්‍රමාණය අවම වීමෙන් සමාජීය අංශය තුළ විවිධ ගැටලු පැන නැගී තිබේ. ප්‍රධාන වශයෙන්ම සමාජයක් ඉදිරියට ගමන් කිරීමේ ගාමක බලවේගයක් වන අධ්‍යාපනය කඩා වැටීමට ද මෙම පොහොර අර්බුදය වක්‍රාකාරව බලපා තිබේ. එනම් පොහොර අර්බුදයත් සමග ආර්ථික මට්ටම පහත වැටීම නිසා වී වගාකරුවන්ට අධ්‍යාපන අංශය වෙත යෙදවිය යුතු මුදල් ප්‍රමාණවත් නොවීම නිසාත්, ආර්ථිකය බිඳ වැටීම හේතුවෙන් ජීවන වියදම අධික වීම නිසා ළමුන් අධ්‍යාපනයෙන් ඉවත් වී රැකියා වෙත යොමු වීමත් නිසා පොහොර අර්බුදයෙන් පසු අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ යම් බිඳවැටීමක් හඳුනාගත හැකිය.

**වගුව: අධ්‍යාපනයට බාධා එල්ලවීම**

| ස්වරූපය | පවුල් ගණන | ප්‍රතිශතය |
|---|---|---|
| අධ්‍යාපනයට බාධා එල්ල වී නැත | 11 | 31.42% |
| අධ්‍යාපනයට බාධා එල්ලවීම | 24 | 68.57% |
| එකතුව | 35 | 99.99% |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2023

මේ අයුරින් වී ගොවි පවුල් වැඩි ප්‍රමාණයක අධ්‍යාපනයට බාධා එල්ලවීම එම වී ගොවි සමාජය තුළ අනාගත සමාජීය තත්ත්වය වර්ධනයේදී ගැටලුවක් බවට පත් වේ. වී අස්වැන්න අඩුවීම නිසා වී ගොවි පවුල්වල ආර්ථික මට්ටම පහළ වැටීමෙන් අධ්‍යාපනය වෙනුවෙන් දැරිය හැකි පිරිවැය අවමවීම මේ අයුරින් විශාල පිරිසකගේ අධ්‍යාපන මට්ටම පහළ වැටීමට හේතු වී තිබේ. අධ්‍යාපනය ලබන ළමුන්ට ප්‍රවාහන වියදම්, උපකාරක පන්ති වියදම් ඉහළ යාම මත වී අස්වැන්න අඩු වීමෙන්

ආර්ථික මට්ටම පහළ යාම නිසා එම වියදම් සැපයීම වී වගාකරුවන්ට අපහසු වී තිබේ. එය අධ්‍යාපනය ලබන ළමුන්ගේ අධ්‍යාපනයට බාධා එල්ල වීමකි. ඉදිරි අනාගතයේ අධ්‍යාපනය සම්බන්ධ ඌණතා ඇති කිරීමට හේතු විය හැක.

"අධ්‍යාපනය ලැබීමට අවශ්‍ය පොත්පත් ආදියෙහි මිල ඉහළයාම නිසා ද වී නිෂ්පාදනය අඩු වීම හේතුවෙන් වී විකුණා සෑම ක්‍රියාවක්ම සිදු කිරීමට නොහැකිය. එම නිසා අධ්‍යාපනයට ද බලපා තිබේ" (පුරුෂ - (58)

ආර්ථික අර්බුදය හා පොහොර අර්බුදය සෘජුවම මෙම ප්‍රදේශය තුළ ළමුන්ගේ අධ්‍යාපනයට බාධා එල්ල කර ඇති බව බව උක්ත ප්‍රකාශය අනුව පැහැදිලි වේ. අධ්‍යාපනික උපකරණවල මිල ඉහළයාමත්, ඒවා සපයා ගැනීමට තරම් වී අස්වැන්න විකුණා ලැබෙන මුදල් ප්‍රමාණවත් නොවීමත් මත මෙම ප්‍රදේශයේ වී ගොවීන්ගේ පවුල් තුළ අධ්‍යාපනයට බාධා එල්ල වී තිබේ. පොහොර අර්බුදයත් සමග වී ගොවි පවුල් තුළ ඇති වූ අස්ථාවර ආර්ථික මට්ටම හේතුවෙන් අධ්‍යාපනයට බාධා එල්ලවීම පමණක් නොව අධ්‍යාපනයෙන් ඉවත් වීමේ තත්ත්වය ද හඳුනාගත හැකිය.

"දියණිය පෞද්ගලික අධ්‍යාපන පාඨමාලා හදාරමින් සිටියා. පොහොර අඩු උනාම වී අඩු වුන නිසා මුදල් හිඟ වීමෙන් එම පාඨමාලාව නවතා දැමීය."(පුරුෂ - 52)

වී අස්වැන්න අඩුවීම නිසා වී වගාකරුවන්ගේ ආර්ථික මට්ටම අඩු වී තිබේ. එය සෘජුවම වී ගොවි පවුල්වල අධ්‍යාපනයට බලපා තිබේ. පෞද්ගලික අධ්‍යාපන පාඨමාලා සම්පූර්ණයෙන්ම මුදල් මත පදනම් වීම නිසා ඒවාට අවශ්‍ය මුදල් සපයා ගැනීමට නොහැකි වීමෙන් එම

අධ්‍යාපන කටයුතුවලින් ඉවත් වී තිබේ. එය සමාජීය තත්ත්වය පහත වැටීමට හේතු වේ.

"අධ්‍යාපනයට බාධා එල්ල එල්ලවී තිබේ. දෙවන වර උසස් පෙළ විභාගයට මුහුණ දීමට අපේක්ෂාවෙන් සිටි දියණිය මුදල් නොමැතිකම හේතුවෙන් එය අතහැර දැමීය." (පුරුෂ - 60)

උක්ත ප්‍රකාශයට අනුව ආර්ථික අර්බුදය හේතුවෙන් වී නිෂ්පාදනය පහත වැටීම මත අධ්‍යාපනය ලබන ළමුන් අධ්‍යාපනයෙන් ඉවත් වී ඇති බව හඳුනාගත හැකිය. උසස් පෙළ විභාගයට මුහුණ දීමෙන් ඉවත්වීම එම අධ්‍යාපනය ලබන ළමුන්ට තම සමාජ තත්ත්වය වර්ධනය කර ගැනීමට ඇති ඇතැම් අවස්ථා මඟ හැරීමකි. එය මෙම සමාජය තුළම ප්‍රාථමික වී නිෂ්පාදනයේ යෙදෙන පුද්ගලයන් පමණක් ඇති කිරීමට හේතු විය හැකිය. එසේම මෙම අධ්‍යයනය ප්‍රදේශය ආශ්‍රිතව අධ්‍යාපනය ආශ්‍රිත ගැටලුවක් ලෙස අධ්‍යාපනය ලබන වයසේ ළමුන් රැකියා සඳහා යොමුවීම පෙන්වා දිය හැකිය.

" සතියට දවස් 4ක්වත් කුලී වැඩ කරනවා." පුරුෂ - 14)

උක්ත ප්‍රකාශයට අනුව ළමුන් අධ්‍යාපනයෙන් ඉවත් වී වෙනත් රැකියා වලට යොමුවීම අධ්‍යාපනයට ප්‍රමාණ ගැටලුකාරී තත්ත්වයක් ඇති කරයි. මෙම ප්‍රදේශය තුළ වී වගාවේ නිරත, වී වගාකරුවන්ගේ පවුල්වල ළමුන් වී අස්වැන්න අඩුවීම නිසා ආදායම් මට්ටම පහළ යාමෙන් පවුලේ ආදායම් මට්ටම නගාසිටුවීම අරමුණු කරගෙන අධ්‍යාපනයෙන් ඉවත් වී වෙනත් සුළු රැකියා සඳහා යොමු වී තිබේ. එය එම ළමුන්ගේ මෙන්ම එම පවුල්වල සමාජ තත්ත්වය පසුබෑමට ලක්වීමට හේතු වී තිබේ.

" කුඹුරු කාලෙට කුඹුරු වැඩ" පුරුෂ - 16)

ශ්‍රම හිඟය පියවා ගැනිමට පවුලේ සියලු දෙනා වි ගොවිතැනට යොමුවිම තුල ලම ශ්‍රමිකත්වයක් හදුනාගත හැකි අතර පාසල් යා යුතු දරුවන් වි ගොවිතැන ආශ්‍රිත ශ්‍රම කටයුතුවල නිරතවන අතර ඒ සදහා වේතනයක් ද හිමි නොවේ. ශ්‍රමය සුරාකෑමක් නිරුපණයවේ. පිරිමි ළමුන් කෘෂි භුමිවලද ගැහැනු ළමුන් නිවෙස්වල කටයුතු සදහා ද යොදාගෙන ඇත. මේ හේතුවෙන් අඛණ්ඩ පාසල් අධ්‍යාපනයක් නොලබයි.

**කේන්ද්‍ර පරිධිය ශ්‍රම ගලනය**

මෑත කාලීනව ශ්‍රී ලංකාවේ පවතින ආර්ථික අර්බුදය වී ගොවිතන ගැටලුකාරි මට්ටමකට පත් වීමට හේතු වූ අතර එය ඍජුවම ග්‍රාමිය කෘෂි පවුලේ ආර්ථිකයට බලපාන ලදී. කෘෂි ආර්ථිකයට බලපෑම් ඇතිවීම කෘෂි ආර්ථිකය මත පදනම් වන රටේ ආර්ථිකයට ද බලපානු ලබයි. ආර්ථික ගැටලු හේතුවෙන් ග්‍රාමිය වි ගොවිතැන අතහැර නාගරික කර්මාන්ත සහ සේවාවලට තල්ලුවිමක් හදුනාගත හැකිය. කේන්ද්‍ර පරිධිය සබදතාව හදුනාගත හැකිය. නාගරික සේවා හා කර්මාන්තවල ශ්‍රම හිඟය සදහා මෙම කොටස තල්ලුවිමක් හදුනාගත හැකිය.

**වගුව: රැකියා අපේක්ෂාවෙන් ශ්‍රම සංක්‍රමණය වීම**


| ස්වභාවය | පවුල් ගණන | ප්‍රතිශතය |
|---|---|---|
| පවුල තුළම රැදී සිටීම | 24 | 68.57% |
| රැකියා අපේක්ෂාවෙන් පවුලෙන් ඉවත්වීම | 11 | 31.42% |
| එකතුව | 35 | 99.99% |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2023

තරුණ ප්‍රජාව කෘෂිකර්මාන්තයෙන් ඉවත්වීමට ප්‍රධානතම හේතුව ලෙස ආදායම් හා අලෙවි ප්‍රශ්නය හඳුනාගත හැකිය. හොද මිලක් ලබා ගැනීමට නොහැකි වීම ,ජල ගැටලු, දේශගුණික ගැටලු , ඉඩම්වල ගැටලු

සහ පොහොර යන්ත්‍ර සූත්‍ර ලබා ගැනීමේදී මූල්‍යමය ගැටලු සහ පැරණි බැංකු ණය ආදිය හේතුව ඇත. එසේම යටිතල පහසුකම් සංවර්ධනයේ අඩුව, තාක්‍ෂණික හිඟය සහ සේවා සහ අධ්‍යාපන හා රැකියා ඉලක්ක සඳහා තරුණ ප්‍රජාව කෘෂිකර්මාන්තය අතහැර ගමින් නගරයට සංක්‍රමණය වූ අතර කෘෂිකාර්මික හා වැවිලි ක්ෂේත්‍රයේ පැහැදිලි ආර්ථික ප්‍රතිලාභයක් හඳුනා ගැනීමට නොහැකි වීම සහ කෘෂිකර්මාන්තය ස්ථිර නොවන ආර්ථික ක්‍රියාකාරකමක් ලෙස තරුණ ප්‍රජාව නිර්වචනය කිරීමේ පසුගාමීත්වය තරුණ ප්‍රජාව කෘෂිකර්මාන්තයෙන් වෙනත් ආර්ථික කටයුතුවලට යොමු වීමට බලපාන ප්‍රධාන සාධකයයි.


**විහීනතා උගුල : රොබට් චෙම්බර්**



අවිධිමත් ණය ගැනිම, ඉඩම් අහිමිවිම , වි ගොවිතැන තුල දිර්ඝ කාලීන මුහුණ පානු ලබන අලාභය ආදි තත්වයන් හේතුවෙන් වර්තමාන ආර්ථික අර්බුදය හමුවේ මෙම ගොවි පවුල් තුල ආර්ථික ශක්‍යතාවය ගිලිහි යාම තුල දරිද්‍රතාවයෙන් පෙළෙන බව හදුනා ගත හැකිය. රොබට් චෙම්බර් විසින් සම්පාදිත *Rural Development* කෘතියේ පෙන්වා දෙන විහිනතා උගුල නම් සංකල්පය මෙම ගොවි පවුල් තුලින් නිරූපණය වේ. දරුවන්ගේ අධ්‍යාපනට අඩාලවිම තුල වර්තමාන පරම්පාරව මෙන්ම ඊළඟ පරම්පරාවගේ ද දරිද්‍රතාවය හදුනා ගත හැකිය. පෝෂයදායි ආහාර අවමවිම සහ ගොවිබිම්වල ශ්‍රමය සැපයිම තුල කාන්තාවන් සහ දරුවන්ගේ පෝෂණ ගැටලු සහ රෝග හදුනාගත හැකිය.

**දරිද්‍රතාවයේ සංස්කෘතියඃ ඔස්කා ලෙවිස්**

එමෙන් ම වි ගොවිතැන පිලිබද පවතින සෘණාතමක ආකාල්ප සහ වි ගොවිතැන වර්තමානයේ ආර්ථික අර්බුදය හමුවේ මුහුණ පා සිටින ගැටලු හමුවේ මෙම ප්‍රජාව ආන්තිකරණයවිමක් හදුනාගත හැකිය. ආර්ථික ශක්තිය ගිලි හි යාම තුල සමාජ බලයද ගිලිහියාමක් සහ වර්තමාන ආර්ථික අර්බුදය හමුවේ අවදානකම්සහගත කණ්ඩායමක් ලෙස වි ගොවිතැන සිදුකරන මෙම සමාජ කණ්ඩායම හදුනාගත හැකිය. එනම් වර්තමාන ආර්ථික අර්බුදය හමුවේ මෙම ප්‍රජාව තුල දරිද්‍රතාවයේ විෂම චක්‍රයක් ගොඩනැගි ඇති අතරම ඒතුල ඔස්කා ලෙවිස් වැනි චින්තකයන් හදුන්වා දුන් දිළිදුකමේ සංස්කෘතියක් ගොඩනැගිමට ආර්ථික අර්බුදය හේතුවෙමින් පවතින බව හදුනාගත හැකිය. "දරිද්‍රතාවයේ සංස්කෘතිය" පිළිබඳ න්‍යාය නිර්මාණය කරන ලද්දේ මානව විද්‍යාඥ ඔස්කාර් ලුවිස් විසින් (1959) දී ඔහුගේ *Five Families: Mexican Case Studies in the Culture of Poverty* යන කෘතියෙනි.




දරිද්‍රතා සංස්කෘතිය න්‍යායේ පවසන්නේ දරිද්‍රතාවයේ පැතිරී යන තත්ත්වය තුළ ජීවත්වීම එම තත්වයන්ට අනුවර්තනය වූ සංස්කෘතියක් හෝ උප සංස්කෘතියක් වර්ධනය වීමට හේතු වන බවයි. මෙම සංස්කෘතිය අසරණ භාවය, යැපීම, ආන්තිකභාවය සහ බල රහිතභාවය පිළිබඳ පුළුල් හැඟීම් වලින් සංලක්ෂිත වේ. තවද, ලුවිස් විස්තර කළේ දරිද්‍රතාවයේ සංස්කෘතියක් තුළ ජීවත් වන පුද්ගලයන් ඉතිහාසය පිළිබඳ අඩු හෝ හැඟීමක් නොමැති අය ලෙසත්, එබැවින් සාමූහික ක්‍රියාකාරකම් තුළින් තමන්ගේම තත්වයන් සමනය කර ගැනීමට දැනුමක් නොමැති බවත්, ඒ වෙනුවට ඔවුන්ගේම කරදර කෙරෙහි පමණක් අවධානය යොමු කරමිනි. මේ අනුව, ලුවිස්ට, දරිද්‍රතාවයේ සංස්කෘතියක් වර්ධනය කිරීමේ ව්‍යුහාත්මක හේතුව වූයේ දරිද්‍රතාවයේ සංස්කෘතියක් වර්ධනය වීමට

ලුවිස්ගේ ව්‍යුහාත්මක හේතුව වන අතර, එය පසුව ස්වාධීන බවට පත්වන අතර, දරිද්‍රතාවයේ සංස්කෘතියක් තුළ වර්ධනය වන හැසිරීම් සහ ආකල්ප සමාජකරණ ක්‍රියාවලීන් හරහා පසු පරම්පරාවන්ට සම්ප්‍රේෂණය වේ.

**නව මාක්ස්වාදී තර්කය**

රටක සංවර්ධන ක්‍රියාවලියේ මුඛ්‍ය පරමාර්ථය ලෙස ආර්ථික වෘද්ධිය ළගාකර ගැනීම හදුනාගත හැකිය. ආර්ථික සාධකය ග්‍රාමීය සමාජයේ වෙනස්වීම සදහා ප්‍රබල බලපෑම් කරනු ලබන බව ඒ ආශ්‍රිතව ගොඩනැගුනු සංකල්ප හා න්‍යායත්මක පසුබිම අධ්‍යනය මගින් විද්‍යාමාන වේ. දකුණු ආසියාතික රටක් වන ශ්‍රී ලංකාව ද ග්‍රාමීය ශිෂ්ඨාචාරයකින් බිහිවී ඇති රාජ්‍යය කි. අතීතයේ පමණක් නොව වර්ථමානයේ ද ශ්‍රී ලංකා ජන සමාජය තුළ ග්‍රාමීය සමාජ ඒකක හඳුනාගත හැක. මෙහිදී ගැමි සමාජයේ ආර්ථික පිළිබඳ අධ්‍යයනයේදී ප්‍රධාන වශයෙන් නව මාක්ස්වාදී තර්කය වැදගත් වේ. එහිදී ගුන්ඩර් ෆ්‍රැන්ක්, පෝල් බරාන් , සමීර් අමීන් වැදගත් වේ. මොවුන් ප්‍රධාන වශයෙන් තුන්වන ලෝකයේ රටවල ගැමි සමාජ පසුගාමී තත්වයක පසුවන්නේ අධිරාජ්‍යයවාදී රටවල් නව මුහුණුවරකින් සූරා කෑමට ලක් කරන නිසා බව දක්වයි. *Peasant and peasant societies* කෘතිය මගින් තියඩෝර් ශයිනි ග්‍රාමීය සමාජය ආර්ථිකය සමග පවතින සම්බන්ධය පිළිබද න්‍යායාත්මක විග්‍රහයක යෙදී ඇත. ආර්ථිකය තුළ අන්තර්ගත වී ඇත්තේ නිෂ්පාදනය බෙදාහැරීම හා පරිභෝජනයයි.

**කේන්ද්‍ර පර්යන්ත සබදතාවය**

ගම නම් සංකල්පය නවීකරණය වී වෙනස්කම් වලට භාජනය වී ඇත. එහෙත් ග්‍රාමීය සංකල්පය තවමත් සමාජයේ පවතින සංකල්පයකි. එනම් ග්‍රාමීය ප්‍රදේශයක් යනු ප්‍රාථමික ගෝත්‍රික සමාජයක් සහ නූතන නාගරික

ප්‍රජාව අතර පවතින අතරමැදි තත්වයක් ලෙස සඳහන් කරයි. (රෙඩ්ෆීල්ඩ්,1930) එමෙන්ම ගැමි සමාජයේ සූරාකෑමේ ක්‍රියාවලිය පිළිබඳ ෆෑන්ක් අදහස් දක්වන අතර සම්පත් සූරාකෑමට පාදක වූ කරුණු ලෙස වෙළඳපොළ, ඉඩම් හිමිකම, ප්‍රවාහනය, පොදු පහසුකම් වේ. ෆ්‍රැන්ක් පෙන්වා දෙන්නේ කේන්ද්‍ර පර්යන්ත සම්බන්ධතාවය මගින් ගැමි සමාජයන්හි අතිරික්තය අහිමි කිරීමක් සිදුවන බව හා එමනිසා දිගින් දිගටම ඌණ සංවර්ධිතභාවයකට ගොදුරුව ඇති බවයි. එමනිසා මෙම කේන්ද්‍ර පර්යන්ත සබඳතාවය බිඳවැටීම තුළ ගැමි සමාජයන්හි අතිරික්තය අහිමි නොවේ.(හඳරාගම,2011) මෙහිදී ප්‍රධාන කථිකයෙකු වන අන්ඩර් ගුන්ඩර් ෆෑන්ක් ප්‍රධාන වශයෙන් "සංවර්ධනයේ ඌන සංවර්ධනය" (Development of Underdevelopment) සහ "පද්ධතික සූරාකෑම" (model of metropolis satellite exploitation)වැනි ආකෘතීන් මගින් නව මාක්ස්වාදී විග්‍රහයේ යෙදෙයි. එහිදී ඔහුගේ ප්‍රසිද්ධ කෘතිවන, *Capitalism and underdevelopment of Latin America (1967) / Latin America : Underdevelopment or Revolution (1969)* මගින් පෙන්වා දෙන ආකාරයට ආර්ථික සංවර්ධනය හා ඌණ සංවර්ධනය එකම කාසියක දෙපැත්තක් වැනිය.

අතීතයේ ගම්වාසින්ගේ ජීවන රටාව පරිභෝජන රටාව නිෂ්පාදන කියාවලිය ගොඩනැගී ඇත්තේ හේන් වගාව - වී ගොවිතැන මූලික කොටගත් සාම්පදායික කෘෂිකර්මාන්තය මත පදනම්වය අතීතයේ ගොවියා තමා විසින්ම නිෂ්පාදනය කෙරෙන එම නිෂ්පාදනයන් පරිභෝජනය කරන ලැබුවේද ඔවුන් විසින්මය එම නිසා ඒ සමය තුළ නිෂ්පාදනය කරන ලබන දෑ ගමයෙන් පිටතට බෙදා හැරීම දැකගත නොහැකි විය ඒ කාලය තුළ නගරය හා ගම තුළ පැවතියේ ඉතා දුරස්ථ සම්බන්ධතාවයකි


නමුත් වී ගොවිතැන ආශිතව ජීවන උපාය මාර්ගයක් ගොඩනගා ගැනීමත් සමග ගම තුළ නිෂ්පාදනය කරන ලබන දෑ පරිහරණය නොවී ගමෙන් පිටතට බෙදා හැරීමත් ඔවුන්ගේ එදිනෙදා පරිභෝජනයට අවශ්‍ය සියලුම ද්‍රව්‍ය නගරයෙන් මිලදී ගැනීමත් සිදු වේ' මෙම කියාවලිය හමු වේ ගුන්ඩර් ෆැන්ක් විසින් හඳුන්වා දෙනු ලැබු කේන්ද්‍රය විසින් පරිධිය සූරාකෑමේ න්‍යායාත්මක සංකල්පයේ සත්‍යතාවයක් වී ගොවිතැන ආශිතව දැක ගැනීමට හැකි වේ' මෙහිදී කේන්ද්‍රය වන නගරය විසින් පරිධිය වන ගම සතු සම්පත් "නිෂ්පාදනය සූරා කෑමට ලක් කරයි' ලෝකයේ සංවර්ධිත රටවල් විසින් ඌන සංවර්ධිත රටවල් වල සම්පත් සූරා කෑම පදනම් කරගෙන කේන්ද්‍ර පරිධි න්‍යාය ලෙස ගොඩනැගී ඇත' මෙම සූරාකෑමේ කි්‍රයාවි,ය ජාතික මට්ටමින්ද දැකගත හැකි අතර රාජ්‍ය අභ්‍යන්තරයේ පවතින ගම සහ නගරය අතර පවතින සම්බන්ධතාවය තුළින්ද ඉස්මතු වී ඇති බව ඉහත කරුණු තුළින් පැහැදිලි වේ' මෙය අවසානයේ අන්තර්ජාතික වෙළඳපළ දක්වා විකාශනය වී ගොස් අන්තර්ජාතික වෙළදපල ශක්තිමත් කරනු ලබයි

## තල්ලුකිරිමේ Push සාදක සහ ඇදගැනිමේ Pull සාධක

Everett Leeගේ Push & Pull Factor සංක්‍රමණය පිළිබද න්‍යාය මගින් විශ්ලේෂණය කිරිමේ දි හඳුනා ගත හැකිවන්නේ වර්තමාන ආර්ථික අර්බුදය හමුවේ වී ගොවිතැන ආශ්‍රිත ශ්‍රමය වෙනත් සේවා හා කර්මාන්ත වෙත තල්ලුවිමකි. මෙහිදි වී ගොවිතැනෙන් ගොවින් ඉවත්විමට බලපාන ලබන තල්ලුකිරිමේ Push සාදක සහ ඇදගැනිමේ Pull සාධක පිළිබද අවධානය යොමු කිරිමේ දි

**තල්ලුකිරීමේ සාධක**

- ආර්ථික අර්බුදය හමුවේ ජීවන වියදම ඉහලයාම
- වී ගොවිතැන ආශ්‍රිත තාක්ශණික (පොහොර , යාන්ත්‍රෝපකරණ මිල අධිකබව) සහ මූල්‍යමය ගැටලු(ණය)
- දේශගුණික හා කාලගුණික අයහපත් තත්වයන්
- ඉඩම් පිළිබඳ ගැටලු
- රාජ්‍ය අවම මැදිහත්වීම් සහ සහනාධාර , වගා හානි නොගෙවීම
- ආර්ථික වාසි අවමවීම
- කායික රෝගවලට ගොදුරුවීම(මී උණ)
- ගොවිතැන පිළිබඳ තරුණයින්ගේ සෘණාත්මක ආකල්ප




**ඇදගැනීමේ සාධක**

- ආර්ථිකමය වාසි ( හොඳ වේතනයක්, රක්ෂණ ආවරණ,ප්‍රවාහන සහ නවාතැන් පහසුකම්)
- බැංකු ණයගැනීමට
- නගරය පිළිබඳ සංවර්ධිත ආකල්පය
- අධ්‍යාපන අවස්ථා සහ රැකියා අවස්තා බහුලවීම
- රැකියාව පිළිබඳ ධනාතමක ආකල්ප
- යටිතල පහසුකම්

ලෙස විශ්ලේෂණය කල හැකිය.

**නිගමන සහ යෝජනා**

මේ අනුව ආර්ථික අර්බුදය හමුවේ තරුණ ගොවියන් වෙනත් විකල්ප ආර්ථික ක්‍රියාකාරකම් වෙත ගමන්කිරිම හරහා වී ගොවිතැන අර්බුදයට ලක්විම නොවැළක්විය හැකි තත්වයට පත්ව ඇත. ශ්‍රම හිගය නිර්මාණය විම සහ ආර්ථික අර්බුදයේ බලපෑම තුල මෙම ප්‍රජාවගේ පවුලේ සිට සමස්ත රටේ ආර්ථිකයට සහ සමාජයට අහිතකර ලෙස එය සෘජුව සහ වක්‍රව බලපානු ලබයි.

ප්‍රාදේශීය වශයෙන් වී ගොවිතැනේ නියැලෙන වී වගාකරුවන්ගෙන් නියැදියක් භාවිතා කරමින් වී වගාකරුවන් ප්‍රමාණයක් තෝරාගෙන ඒ යටතේ වැඩි දුරටත් විමර්ශනය කරමින් මෙම පර්යේෂණය සිදු කරන ලදී. අධ්‍යයන ප්‍රදේශයේ භෞතික, සමාජ, ආර්ථික පසුබිම විමර්ශනය කරමින් අධ්‍යයනය සඳහා පවතින

යෝග්‍යතාව හඳුනාගෙන ඒ අනුව වී වගාකරුවන්ගේ සමාජ, ආර්ථික පසුබිම අධ්‍යයනය කරමින් පර්යේෂණය සිදුකරන ලදි. මෑතකාලීන පොහොර අර්බුදයත් සමග රසායනික පොහොර ලබා ගැනීමට නොහැකි වීම හා පසුකාලීන රසායනික පොහොර මිලකරනය හමුවේ වී අස්වැන්න පහත වැටීම වී වගාකරුවන්ගේ වී නිෂ්පාදනය කෙරෙහි දක්වූ බලපෑම, ඒ මත ආර්ථිකමය වශයෙන් සිදු වූ බලපෑම හා ණය ප්‍රවේශ වෙත යොමුවීමෙන් ඇති වූ ගැටළු, සමාජයීය වශයෙන් අධ්‍යාපනය, සෞඛ්‍ය, සමාජ සබඳතා ආදී සමාජ පසුබිම කෙරෙහි ඇති වූ බලපෑම අධ්‍යයනය කිරීමෙන් අනතුරුව නිගමනයන්ට එළඹීමට හැකි විය.

**නිගමනය**

2021 අප්‍රේල් මස ක්‍රියාත්මක කරන ලද රසායනික පොහොර තහනම් කිරීමේ ප්‍රතිපත්තිය හේතුවෙන් වී නිෂ්පාදනය ඉහළ මට්ටමින් පවත්වාගෙන යාමට අවශ්‍යවන එක් ප්‍රධාන සාධකයක් වන පොහොර භාවිතය රසායනික පොහොර අර්බුදයත් සමඟ ඌන මට්ටමකට පත්වීම නිසා වී නිෂ්පාදනය අඩු වී තිබේ.

පොහොර අර්බුදයට පෙර ප්‍රධාන වශයෙන් වී ගොවිතැන සඳහා රසායනික පොහොර භාවිතා කළ අතර අවශේෂ වශයෙන් කාබනික පොහොර භාවිතයක් සිදුකර ඇත. පොහොර අර්බුදය හා පොහොර මිලකරණය හමුවේ වී අස්වැන්න අඩුවීම නිසා ආර්ථික මට්ටම පහළ වැටීමෙන් වී වගාකරුවන් විධිමත් හා අවිධිමත් ණය ප්‍රවේශ වෙත යොමුවී ඇති අතර ඒ මත වාරික හා පොලී මුදල් ගෙවා ගැනීමට නොහැකි වීමෙන් ආර්ථික අර්බුදකාරී තත්වයකට පත්ව තිබේ. 80%ක් පමණ වී වගාකරුවන් ණය ලබා ගැනීම සඳහා යොමුවී ඇති අතර එය වී වගාකරුවන්ගේ ආර්ථිකය තුළ අර්බුදකාරී තත්ත්වයක් ඇති කිරීමට හේතුවී තිබේ. ණය ලබා ගැනීම මත ඒවා නැවත ගෙවීමට අපහසු වීමෙන් සමාජමය ගැටුම් ඇතිවී තිබේ.

වී ගොවිතැනෙහි නියැළුණු පවුල්වලින් පවුල් 12ක් එනම් 34.28%ක් රැකියා විරහිත තත්ත්වයට පත් වී ඇත. එය එම වී වගාකරුවන්ගේ සමාජ, ආර්ථික පසුබිම කෙරෙහි සෘණාත්මකව බලපානු ලබයි. වී වගාකරුවන්ගේ පවුල්වල අධ්‍යාපනයට බාධා එල්ලවීම අනාගත සමාජ පසුබෑම් කෙරෙහි හේතු වේ. මෙම පවුල්වල සෘණාත්මක අධ්‍යාපන මට්ටමක් ඇති පිරිසක් ඇතිවීමට ඇති ඉඩකඩ වැඩිය. පොහොර අර්බුදයෙන් පසුව ළමුන් අධ්‍යාපනයෙන් ඉවත් වී කුලී රැකියා සඳහා යොමුවීම මෙම පවුල්වල සමාජ තත්ත්වයට ඇති වී ඇති සෘණාත්මක බලපෑමකි. එසේම සැමියා, බිරිඳ පවුල් හැරයාම්, දෙමාපිය දූදරු ගැටළු, මූලික අවශ්‍යතා සපයා ගැනීමේ ගැටලුව, පවුල්වල සෞඛ්‍යයට බලපෑම් ඇතිවීම වැනි සමාජ ගැටළු ඇතිවී තිබේ.

මේ අනුව නිගමනය වන්නේ ආර්ථික අර්බුදයට ප්‍රථවම මුහුණදුන් පොහොර අර්බුදය හමුවේ වි ගොවින්ගේ ආර්ථික ස්ථාවරභාවය බිදවැටි තිබුන බවත්, එම නිසා වර්තමාන ආර්ථික අර්බුදය කලමණාකරණය ගැනිමේ ආර්ථික ශක්‍යතාවය ගිලිහියාම තුළ වී ගොවිතැනෙන් ඉවත් වි සේවා සහ කර්මාන්ත අංශයේ රැකියාවෙත ශ්‍රමය සංක්‍රමණය වීම තුළ මෙරට ආර්ථිකයේ වැදගත්ම අංශයවන කෘෂිකර්මාන්තයේ වි ගොවිතැන විශාල ශ්‍රම හිඟයක් හේතුවෙන් අර්බුදයට ලක්ව ඇති බව සහ එම ප්‍රජාව දරිද්‍රතාවයේ උගුලක සිරව සිටින බවය.

**යෝජනා**

- වාණිජමය වශයෙන් සිදුකරන වී ගොවිතැන ප්‍රධාන ආර්ථික කටයුත්තක් ලෙස වර්ධනය කිරීමට අවශ්‍ය රාජ්‍ය ප්‍රතිපත්ති සකස් කිරීම සිදු කළ යුතුය. කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ ගොවීන් දිරිගන්වමින් ගොවීන් වී වගාව තුළ රඳවා ගැනීමට අවශ්‍ය උපකරණ, මූල්‍යමය ප්‍රතිපාදන ලබාදීම. පොහොර

සහනාධාරය ගොවීන්ට ප්‍රමාණවත් පරිදි සපයාදීම ඔස්සේ වැඩි වී අස්වැන්නක් ලබා ගැනීමට කටයුතු කිරීම.

- ගොවීන්ගේ වී නිෂ්පාදන ඉහළ මිල යටතේ මිලදී ගැනීමට රාජ්‍ය අංශය මගින් ක්‍රමවත් යාන්ත්‍රණයක් සකස් කිරීම.
- වී වගා නොකරන කාලසීමාව තුළ ගොවීන්ගේ ආර්ථිකය නගා සිටුවීමට වෙනත් කව්පි, මුං ආදී කෙටිකාලීන බෝග වගා කිරීම ප්‍රවර්ධනයට කටයුතු සැලසීම හා අඩු මිලට බීජ සැපයීම.
- ගොවීන් රසායනික පොහොරවලට අමතරව කාබනික පොහොර භාවිතා කිරීම වෙත දිරිගැන්වීම. කාබනික පොහොර දිරිගැන්වීම සඳහා ගොවීන් විසින්ම කාබනික පොහොර නිපදවා අලෙවි කිරීමේ ප්‍රවේශ ඇති කිරීම හා ගොවීන්ට පුහුණුව හා දිරිමත් කිරීම් ලබාදීම.
- වී ගොවි පවුල්වල සමාජ තත්ත්වය නගාසිටුවීම උදෙසා වී ගොවි පවුල්වල අධ්‍යාපනය නගා සිටුවීමට ග්‍රාමීය පාසල් දියුණු කිරීම හා ළමුන් අධ්‍යාපනය ලැබිය යුතු කාලයේ වෙනත් ගොවිතැන් කටයුතුවල නිරත වීම වැළැක්වීමට පාසල් තුළ පැමිණීමේ දීමනා ක්‍රමයක් ඇති කිරීම. ර
- මූල්‍ය හා බැංකු කලමණාකරණය හා ණය පිලිබද විධිමත් ක්‍රියාවලියක් සකස් කිරිම
- වගා හානි සදහා ආධාර සහ ගොවින්ට ආර්ථික වශයෙන් ස්ථාවර විමට ගොවි සමිති මට්ටමින් වැඩසටහන් ක්‍රියාත්මක කිරිම
- දේශිය වී ගොවිතැන සහ දේශිය ඥානය යොදාගැනීමට ගොවීන්ට පුහුණුව හා දිරිමත් කිරීම් ලබාදීම.

## ආශ්‍රිත ග්‍රන්ථ

ඉන්ද්‍රකීර්ති, එස්. (1993) ශ්‍රී ලංකාවේ කෘෂි ඉතිහාසය. කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

උඟුව පළාත් ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව. (2021) ඌව පළාතේ ඉඩම් භාවිතය

ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව. Retrieved from: https:// www.statistics .gov.lk/home_si.asp.

බඩල්කුඹුර ගොවිජන සේවා මධ්‍යස්තානය. (2023) රසායනික පොහොර නිකුත් කිරීම

බඩල්කුඹුර ගොවිජන සේවා මධ්‍යස්ථානය. (2023) කාබනික පොහොර නිකුත් කිරීම

බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය. (2023) සම්පත් පැතිකඩ. බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

විජයබණ්ඩාර,කේ. (2004) දුප්පත් බතට විස. කර්තෘ ප්‍රකාශන.

විමලකීර්ති,එම්. (2002) සිංහල ගොවිතැන. කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

ශ්‍රී ලංකා මහ බැංකුව. (2021) 2014 - 2019 කාලය තුළ පවත්නා වෙළෙඳපොළ මිල අනුව වී වගාව දළ දේශීය නිෂ්පාදිතය සඳහා දක්වන දායකත්වය. කොළඹ: ශ්‍රී ලංකා මහ බැංකුව.

ශ්‍රී ලංකා මහ බැංකුව. (2023) වී නිෂ්පාදනය. කොළඹ: ශ්‍රී ලංකා මහ බැංකුව.

ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව. (1982) අංක 70 මොනරාගල මෙට්‍රික් සිතියම

හදරාගම එස්. සහ රස්නායක එස්. (2011) සංවර්ධන සමාජවිද්‍යාව, සමීර ප්‍රකාශකයෝ.

හෙට්ටිආරච්චි, යු. (1998).) ශ්‍රී ලංකාවේ දේශීය කෘෂිකර්මය. පුබුදු ප්‍රින්ටර්ස්.

Begum, A. A., & Manos, B. (2005). Impacts of fertilizer pricing policy in Bangladesh:

A multicriteria analysis. *Agricultura Tropical et Subtropical*, 38(2), 6-18.6

Bonilla Cedrez, C., Chamberlin, J., Guo, Z., & Hijmans, R. J. (2020). Spatial variation

in fertilizer prices in Sub-Saharan Africa. *PloS one*, 15(1), e0227764.

Department of Census & Statistics. (2009). *Sri Lanka Demographic & Health survey 2018*, Colombo. Retrieved from; https:// www.statistics,gov.lk Accessed on 20 December 2022

Department of Census and Statistics. (2022). Poverty Indicators 2019.Retireved from http://www.statistics.gov.lk/Poverty/StaticalInformation/PovertyIndicators-2019 Dulanjani, P. A., & Shantha, A. A. (2021). Micro-economic impact of fertilizer subsidy in paddy cultivation in Sri Lanka. *Am. J. Hum. Soc. Sci. Res.*, *5*(4), 86-95.

Ekanayake, H. K. J. (2009). The impact of fertilizer subsidy on paddy cultivation in Sri Lanka. *Staff studies*, 36(1).

Emmanuel, D., Owusu-Sekyere, E., Owusu, V., & Jordaan, H. (2016). Impact of agricultural extension service on adoption of chemical fertilizer: Implications for rice productivity and

development in Ghana. *NJAS-Wageningen Journal of Life Sciences*, 79, 41-49.

Fahmid, I. M., Jamil, A., Agustian, A., Hatta, M., Aldillah, R., Yofa, R. D., & Susilowati, S. H. (2022). Study of the impact of increasing the highest retail price of subsidized fertilizer on rice production in Indonesia. *Open Agriculture*, 7(1), 348-359.66

Harris, D. R., & Fuller, D. Q. (2014). Agriculture: definition and overview. *Encyclopedia of global archaeology*, 104-113.

Hashimi, R., Matsuura, E., & Komatsuzaki, M. (2020). Effects of cultivating rice and wheat with and without organic fertilizer application on greenhouse gas emissions and soil quality in Khost, Afghanistan. *Sustainability*, 12(16), 6508.

Henegedara, G. (2002). Agricultural Policy Reform in the Paddy Setor in Sri Lanka: An Overview. *Sri Lanka Journal of Agriculture, 10*(1), 1-25.

Herath, H. M. K. V., Gunawardena, E. R. N., & Wickramasinghe, W. M. A. D. B.(2015). The impact of "Kethata Aruna" fertilizer subsidy programme on fertilizer use and paddy production in Sri Lanka. *Tropical Agricultural Research, 25*(1).

International Water Management Institute (IWMI), (2005). *Development Strategy for the Irrigation Sector in Sri Lanka 2006-2016.* Colombo: International Irrigation Management Institute.

Jayne, T. S., Mather, D., Mason, N., & Ricker-Gilbert, J. (2013). How do fertilizer subsidy programs affect total fertilizer use in sub-

Saharan Africa? Crowding out, diversion, and benefit/cost assessments. *Agricultural economics*, 44(6), 687-703.

Karunanayaka, K. J., & Aponsu, G. M. L. M. (2019). Forecasting Paddy Production in Yala And Maha Seasons in Sri Lanka.

Rahman, K. A., & Zhang, D. (2018). Effects of fertilizer broadcasting on the excessive use of inorganic fertilizers and environmental sustainability. *Sustainability*, 10(3), 759.

Ramli, N. N., Shamsudin, M. N., Mohamed, Z., & Radam, A. (2012). The impact of fertilizer subsidy on Malaysia paddy/rice industry using a system dynamics approach. *International Journal of Social Science and Humanity*, 2(3), 213.

Ranathunga, L. N., Wijemanna, W. M. D. I. S., Sathsara, M. G. S., & Gamage, R. G. B. K. (2018). Agriculture in Sri Lanka: The Current Snapshot. International Journal of Environment. *Agriculture and Biotechnology*, 3(1), 118-125.

Razmy, A. M., & Ahmed, A. N. (2005). Trends in Paddy Production in Sri Lanka. *Journal of Management*, 26-33.

Rodrigo, C., & Abeysekera, L. (2015). Why the fertilizer subsidy should be removed: key factors that actually derive the fertilizer demand in paddy sector of Sri Lanka. *Econ Res*, *3*, 71-98.

Shantha, A. (2011a). Technical Efficiency in Stochastic Frontier Production Model: A case Study of Irrigated Paddy Farming Under Village Tanks in Sri Lanka. *Eight International Conference on*

*Business Management* (pp. 9-26). Colombo: University of Sri Jayawardanepura.

Shantha, A. A., & Ali, B. A. (2014). Economic value of irrigation water: a case of major irrigation scheme in Sri Lanka. *Journal of Agricultural Sciences–Sri Lanka*, *9*(1).

Sisirakumara, M. P. S. S., Karunarathna, M., & Athukorala, W. (2018). An Economic Evaluation of Fertilizer Subsidy on Paddy Production in Sri Lanka. *MODERN SRI LANKA STUDIES*, 47.

Suppiah, R., & Yoshino, M. (1986). Some agroclimatological aspects of rice production in Sri Lanka. *Geographical review of Japan, Series B.*, *59*(2), 137-153.

Wanninayake, S., & Semasinghe, M. (2014). Economic and Social Cost of Fertilizer Subsidy on Paddy Farming in Sri Lanka. *International journal of Science and Research (IJSR), Vo*, *3*, 1261.

Weerahewa, J., Kodithuwakku, S. S., & Ariyawardana, A. (2010). The fertilizer subsidy program in Sri Lanka.

Wijetunga, C. S., & Saito, K. (2017). Evaluating the fertilizer subsidy reforms in the rice production sector in Sri Lanka: A simulation analysis. *Advances in Management and Applied Economics*, *7*(1), 31.

Wu, Y., Wang, E., & Miao, C. (2019). Fertilizer use in China: The role of agricultural support policies. *Sustainability*, 11(16), 4391

Yogarajah, B. (2003). *Forcasting the Paddy Production in Sri Lanka* (Doctoral dissertation, University of Sri Jayewardenepura, Nugegoda).

Yoshino, M. M., & Suppiah, R. (1984). Rainfall and paddy production in Sri Lanka. *Journal of Agricultural Meteorology*, *40*(1), 9-20.